
# මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හඳුනාගැනීම සඳහාවූ ප්‍රතිපත්ති මාර්ගෝපදේශය



**මිනිස් ජාවාරම,
මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ආශ්‍රිත ජාතීන් අතර සිදුවන අපරාධ සම්බන්ධ බාලි ක්‍රියාවලිය**

ප්‍රතිපත්ති සකසන්නන්
සහ වෘත්තීකයන් සඳහාවූ
හඳුන්වාදීමේ මාර්ගෝපදේශයක්



# බාලි ක්‍රියාවලිය

මිනිස් ජාවාරම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ජාතීන් ඔස්සේ සිදුවන අපරාධ සම්බන්ධ බාලි ක්‍රියාවලිය (බාලි ක්‍රියාවලිය) ඕස්ට්‍රේලියානු සහ ඉන්දුනීසියානු රජයන් අතර සම සභාපතිත්වයෙන් සහ සාමාජික රටවල් සහ සංවිධාන 45 කට අධික සංඛ්‍යාවක සහභාගිත්වයෙන් **2002** දී ස්ථාපනය කරන ලද අතර එය ස්වේච්ඡා සහ බැඳීම් ඇති නොකරන ප්‍රාදේශීය උපදේශක ක්‍රියාවලියකි.

මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශය සම්බන්ධ විමසීම් බාලි ක්‍රියාවලිය සම්බන්ධ ප්‍රාදේශීය උපකාර කාර්යාලය **(Regional Support Office (RSO) to the Bali Process)** වෙත යොමුකල යුතුය:

ඊමේල්: **info@rso.baliprocess.net** RSO වෙබ් අඩවිය:
**http://www.baliprocess.net/regional-support-office**

2015 මැයි මාසයේ ප්‍රකාශයට පත්කරන ලදී

# ස්තුතිය

මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශය වර්ධනය කලේ බාලි ක්‍රියාවලි සාමාජිකයන් මගිනි, උපකාර කලෙ ප්‍රාදේශීය උපකාර කාර්යාලය වන අතර නායකත්වය ලබා දුන්නේ පහත සාමාජිකයන්ගෙන් සමන්විත බාලි ක්‍රියාවලි ප්‍රතිපත්ති මාර්ගෝපදේශ කෙටුම්පත් කමිටුව මගිනිඃ

**ලාලු මුහමඩ් ඉක්බාල්,**
ඉන්දුනීසියානු පුරවැසියන් සහ නෛතික ආයතන ආරක්ෂා කිරීම සඳහාවූ වැඩබලන අධ්‍යක්ෂක,
විදේශ කටයුතු පිළිබඳ අමාත්‍යංශය,
ඉන්දුනීසියාව (සම සභාපති)

IOM • OIM

**ජොනතන් මාර්ටෙන්ස්,**
සංක්‍රමණ උපකර ඒකකයේ ප්‍රධානියා, ආසියා සහ පැසිෆික් සඳහා ප්‍රාදේශීය කාර්යාලය,
සංක්‍රමණය සඳහාවූ ජාත්‍යන්තර සංවිධානය (සම සභාපති)

Australian Government
Attorney-General's Department

**මේගන් චාමර්ස්,**
ජ්‍යෙෂ්ඨ නීති නිලධාරී,
මිනිසුන්ට එරෙහි අපරාධ අංශය,
නීතිපති දෙපාර්තමේන්තුව,
ඕස්ට්‍රේලියාව

**මොහොමඩ් ෂිෆාන්,**
නියෝජ්‍ය ප්‍රදාන සංක්‍රමණ නිලධාරී,
ආගමන සහ විගමන දෙපාර්තමේන්තුව,
මාලදිවයින

**රොබට් ලාර්ගා,**
බලපත්‍ර ලබාදීම සහ විධිමත් කිරීම සම්බන්ධ අධ්‍යක්ෂක,
පිලිපීන විදේශ සේවානියුක්ති පරිපාලනය,
පිලිපීනය

**පින්තිප් ලීලක්‍රියන්ග්සක් ශ්‍රීසනිට්,**
මහජන අභිචෝදක,
අන්තර්ජාතික කටයුතු දෙපාරාතමේන්තුව, නීතිපති කාර්යාලය,
තායිලන්තය

Regional Support Office
The Bali Process

කෙටුම්පත් කමිටුවට වැඩිදුර උපකාරඃ
**ටිම් හෝව්,**
අයි.ඕ.එම්. ව්‍යාපෘති සම්බන්ධීකාරක,
ප්‍රාදේශීය උපකාර කාර්යාලය

# බාලි කියාවලිය

# පෙරවදන

මිනිස් ජාවාරම පිළිබඳ බාලි ක්‍රියාවලිය 2002 ආරම්භවූ අවස්ථාවේ සිට මිනිස් ජාවාරම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ජාතීන් ඔස්සේ සිදුවන අපරාධ සම්බන්ධ බාලි ක්‍රියාවලිය (බාලි ක්‍රියාවලිය) මගින් මිනිස් ජාවාරම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ජාතීන් ඔස්සේ සිදුවන අපරාධ මගින් ඇතිවන ප්‍රතිඵල සම්බන්ධ ප්‍රදේශීය අවබෝධය සඵල ලෙස වැඩි කර ඇති අතර, ප්‍රතිචාර වශයෙන් උපාය මාර්ගයන් සහ ප්‍රායෝගික සහයෝගීතාවය ක්‍රියාත්මක කර ඇත. සාමාජික රටවල් 48 සහ ජාත්‍යන්තර සංවිධාන මෙන්ම නිරීක්ෂණ රටවල් සහ ජාත්‍යන්තර ආයතන ගණනාවක් මෙම ස්වේච්ඡා ෆෝරමයට සහභාගිවේ.

බාලි ක්‍රියාවලිය සම්බන්ධ අටවන තත් කාර්ය රැස්වීමේදී, බාලි ක්‍රියාවලි ප්‍රාදේශීය උපකාර කාර්යාලය (RSO) මගින් උනන්දුව ඇති සාමාජික රටවල් සමග සාකච්ඡා කිරීමෙන් අනතුරුව ජාවාරමට ලක්වූ මිනිසුන්ව හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධ කරුණු සඳහා ප්‍රතිපත්ති මාර්ගෝපදේශ කට්ටලයක් වර්ධනය කිරීම නිර්දේශ කරන ලදී. මෙම විධානයට අනතුරුව, RSO මගින් ඉන්දුනීසියානු ජනරජය සහ සංක්‍රමණය සඳහාවූ ජාත්‍යන්තර සංවිධානයේ (IOM) සම සභාපතිත්වය ඇතිව ප්‍රතිපත්ති මාර්ගෝපදේශ කෙටුම්පත් කිරීමට කෙටුම්පත් කමිටුවක් (Drafting Committee) ස්ථාපනය කරන ලදී. මෙම කෙටුම්පත් කමිටුවේ ඉන්දුනීසියානු රජය, ඕස්ට්‍රේලියාව, මාලදිවයින, පිලිපීනය, තායිලන්තය යන රටවල් සහ IOM හි විශේෂඥයන් ඇතුලත්වේ.

කමිටුව මාස හයක කාලයක් පුරා අවස්ථා හතරක හමුවූයේ ජාවාරමට ලක්වූ මිනිසුන්ව හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධ කරුණු සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන් සහ වෘත්තීකයන් හට කෙටි හඳුන්වාදීමේ මාර්ගෝපදේශයන් වර්ධනය කිරීමේ අරමුණ පෙරදැරි කරගෙනය. 2015 මාර්තු 23-24 දිනවල තායිලන්තයේ බැංකොක් හි පැවති සම්පූර්ණ බාලි ක්‍රියාවලි උපදේශාත්මක වැඩමුළුවකදී මාර්ගෝපදේශ සම්බන්ධ කෙටුම්පත් බාලි ක්‍රියාවලි සාමාජිකයන් සහ නිරීක්ෂකයන් හට ලිඛිත අදහස් දැක්වීම සඳහා බෙදාදෙන ලද අතර මේවා සාකච්ඡාවට ලක්කර විමර්ශනය කරන ලදී. ජාවාරමට ලක්කල මිනිසුන්ව හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම සඳහා ප්‍රතිපත්ති සම්පාදනය කරන්නන් සහ වෘත්තීකයන් හට මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන් ප්‍රයෝජනවත් මූලාශ්‍ර වන බවට සහභාගිවූ අය එකඟ විය. සාමාජිකත්වයෙන් ලද අදහස්වලට ප්‍රතිචාර වශයෙන්, කෙටුම්පත් කමිටුව මගින් කෙටුම්පත් සංශෝධනය කරන ලද අතර වැදගත් වෙනස්කම් සහ නිර්දේශයන් ඇතුලත් කරන ලදී.

ප්‍රතිපත්ති මාර්ගෝපදේශය මගින් ජාවාරමට ලක්වූ මිනිසුන්ව හඳුනා ගැනීම සහ ආරක්ෂා කිරීම සම්බන්ධයෙන්, බාලි කාර්යාවලි සාමාජික රටවල ඇති යහපත් පරිචයන් මගින් ලබාගත් උදාහරණ ආශ්‍රයෙන් ජාත්‍යන්තර සහ ප්‍රාදේශීය සම්මතයන් සම්බන්ධ සමස්ථ අදහසක් ලබාදීමට අරමුණු කෙරේ. 2013 අප්‍රියෙල් මාසයේ පැවැත්වූ පස්වන අමාත්‍ය සම්මන්ත්‍රණයේ නිර්දේශයන්ට අනුකූලව මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන් බාලි ක්‍රියාවලියේ අදාල ක්ෂේත්‍ර සහ බාලි ක්‍රියාවලි සාමාජිකයන්ට විශේෂ සැලකිල්ල ඇති ගැටළු මතට වැටෙන බාලි ක්‍රියාවලි ප්‍රතිපත්ති මාර්ගෝපදේශයන්ගේ දෙවන කට්ටලයවේ. මේවා අදාල කර ගැනීම ස්වේච්ඡාවෙන් වන අතර බැඳීම් ඇති නොකෙරේ. මේවායේ අරමුණ වන්නේ බාලි ක්‍රියාවලි සාමාජික රාජ්‍යයන්හි ගෘහස්ථ වශයෙන් ඇති විවිධ ආයතන සඳහා යොමුව සඳහා මෙවලමක් ලෙස භාවිතා කිරීමවේ.

**ලීසා ක්‍රෝෆර්ඩ්**
RSO සම කළමණාකාර (ඕස්ට්‍රේලියාව)

**බෙබෙබි ඒ.කේ.එන්. ජුන්ජුනන්**
RSO සම කළමණාකාර (ඉන්දුනීසියා)

REGIONAL SUPPORT OFFICE
THE BALI PROCESS

## අක්නම් සහ සංකේත නාම

| | |
|---|---|
| ආසියාන් | නිරිතදිග ආසියාතික ජාතීන්ගේ සංවිධානය |
| බාලි ක්‍රියාවලිය | මිනිසුන් ජාවාරම් කිරීම, මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ජාතීන් ඔස්සේ සිදුවන අපරාධ සම්බන්ධ බාලි ක්‍රියාවලිය |
| අයි.එල්.ඕ. | ජාත්‍යන්තර කම්කරු සංවිධානය |
| එම්.ඕ.යූ. | අවබෝධතා ලියවිල්ල |
| එන්.ජී.ඕ. | රාජ්‍ය නොවන සංවිධාන |
| සංවිධානයවූ අපරාධ සම්බන්ධ ප්‍රඥප්තිය | ජාතීන් ඔස්සේ සංවිධානයවූ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තිය |
| ආර්.එස්.ඕ. | බාලි කාර්යාවලිය සම්බන්ධ උපකාර කාර්යාලය |
| මිනිසුන් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටෝකෝලය | ජාතීන් ඔස්සේ සංවිධානයවූ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ප්‍රඥප්තියට උපකාර ලබාදෙන විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් අදාල මිනිසුන් ජාවාරම් කිරීම වැළැක්වීම, මර්ධනය කිරීම සහ දඬුවම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලය |
| යූ.එන්. | එක්සත් ජාතීන් |
| යූ.එන්.එච්.සී.ආර්. | සරණාගතයන් පිළිබද එක්සත් ජාතීන්ගේ මහා කොමසාරිස් |
| යූ.එන්.ඕඩී.සී. | මත්ද්‍රව්‍ය සහ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ කාර්යාලය |

# පටුන


විධායක සාරාංශය 2

**1 වන කොටස: මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හඳුනාගැනීම සම්බන්ධ හැඳින්වීමක් 3**

1.1. මිනිස් ජාවාරමට ගොදුරුවූ අයකු යනු කවරෙකුද? 3
1.2. මිනිස් ජාවාරම අර්ථ නිරූපණය 6
1.3. විවිධ ආකාරයේ සූරාකෑම් අවබෝධකර ගැනීමු 8

**2 වන කොටස: වගකීම්, උනන්දු සහ අභියෝගයන 12**

2.1. හඳුනාගැනීම වැදගත් වන්නේ ඇයි? 12
2.2. මිනිස් ජාවාරමට ගොදුරුවූ අය ඔවුන්ව හඳුනාගැනීමට මැලිවීමට හේතුව අවබෝධකර ගැනීම 14

**3 වන කොටස: මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හඳුනාගැනීම සම්බන්ධ ක්‍රියාවලිය 16**

3.1. මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හඳුනා ගත හැක්කේ කා විසින්ද? 16
3.2. මූලික ක්‍රියාවලි 18
3.3. මිනිස් ජාවාරම සම්බන්ධ දර්ශක 21

**4 වන කොටස: මිනිස් ජාවාරමට ගොදුරුවන අය හඳුනා ගැනීම සම්බන්ධ හොඳුවාවවන්ගේ සාරාංශය 28**

# විධායක සාරාංශය

මිනිස් ජාවාරමට ගොදුරුවුණු අයෙකු යනු **ජාතීන් ඔස්සේ සංවිධානයවූ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තියට උපකාර ලබාදෙන විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් අදාල මිනිසුන් ජාවාරම් කිරීම වැළැක්වීම, මර්ධනය කිරීම සහ දඬුවම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලය මගින් අර්ථ දක්වා ඇති ආකාරයට පුද්ගලිකව මිනිස් ජාවාරමට ලක්වුණු පුද්ගලයෙකි. මිනිස්ජාවාරමට ලක්වුණු අයව හඳුනා ගැනීමට අසමත්වීම මගින් ඔවුන්ව දිගින් දිගටම සූරාකෑමට ලක්වීම සහ ඔවුන් හට ලබාගැනීමට සුදුසු උපකාරවලට ඇති ප්‍රවේශය සහ ආරක්ෂාව ලබා ගැනීමට නොහැකිවීම සිදුවේ. ඒ මගින් අධිකාරීන් විසින් මිනිස් ජාවාරම්කරුවන්ව නීතියේ රැහැනට හසුකර ගැනීමට අවශ්‍ය තොරතුරු සහ සාක්ෂි එක්රැස්කර ගැනීමටද නොහැකිවේ. මෙම දරුණු අපරාධය වැළැක්වීමට සහ එයට සහභාගිවන අයට විරුද්ධව නඩු පැවරීම සඳහා, සහ එයට ගොදුරුවන අයට උපකාර කිරීම සහ ආරක්ෂා කිරීම සඳහා හඳුනාගැනීම ඉතාම වැදගත් අංගයකි.**

මිනිස් ජාවාරමට ලක්වූ අයව නීතිය මගින් අර්ථනිරූපණය කර ඇති ආකාරය සහ ඔවුන් විසින් අත්විඳින සූරාකෑම් ආකාර අවබෝධකරගත් විට වෘත්තීකයන් හට මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගැනීමේ ඉඩකඩ වැඩිවේ. ඒ අනුව, මෙම ප්‍රතිපත්ති මාර්ගෝපදේශය මගින් මිනිස් ජාවාරම සම්බන්ධ පුළුල් විග්‍රහයක් සහ එහි විවිධ ස්වරූපයන් ලබාදේ. මෙම මාර්ගෝපදේශයේ අරමුණු වෙනුවෙන්, මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගැනීම පුළුල් පදනමකින් අවබෝධ කර ගැනේ. මෙයට මුලින්ම හමුවූ අවස්ථාවේ කරන **ආරම්භක හඳුනා ගැනීම** සම්බන්ධ ක්‍රියාවලිය සහ යම් අයෙකු මිනිස් ජාවාරමට ලක්වූ අයෙකු වශයෙන් පූර්වානුමාන කිරීමෙන් පසු මුලින්ම ලබාදෙන උපකාර සහ ආරක්ෂාව ඇතුලත්වේ. වැඩිදුර සාක්ෂි ලැබීමෙන් පසු පුද්ගලයෙකුගේ තත්වය මිනිස් ජාවාරමට ලක්වූ අයෙකු වශයෙන් තහවුරු කිරීම සහ, සමහර අවස්ථාවල, අපරාධ ක්‍රියාවලිය අවසානයේ යම් පුද්ගලයෙකු මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු වශයෙන **නිල වශයෙන් සනාථ කිරීම** ඇතුලත්වේ.

මිනිස් ජාවාරමට ලක්වූ අයෙකුව හඳුනාගැනීම ආවේණික වශයෙන් අපහසු කාර්යයක් වන බැවින් යම් අයෙකුව ගොදුරුවූ අයෙකු වශයෙන් හඳුනා ගැනීමේදී **අඩු මිනුම්දණ්ඩක උපකාර කර ගන්නා ලෙස රාජ්‍යයන් හට මාර්ගෝපදේශය මගින් උනන්දු කෙරේ. ගොදුරුවූ බවට සැක කරන අය සමඟ ප්‍රමාණවත් ආකාරයේ විශ්වාසයක් ගොඩනගා ගැනීමට පෙර අවස්ථාව වන මුලින්ම හමුවූ අවස්ථාවේදී මෙය විශේෂයෙන් වැදගත්වේ. යම් අයෙකු මිනිස් ජාවාරමට ලක්වූ බවට පූර්වානුමාන කලපසු, ඔවුන් හට නිසි උපකාර සහ ආරක්ෂාව ලබාදිය යුතුය. කරන ලද පූර්වානුමානය පදනම් විරහිත බව පසුව සොයාගතහොත්, උපකාර සහ ආරක්ෂාව අවශ්‍යතාවය අනුව වෙනස්  කිරීම හෝ ඉල්ලා අස්කර ගැනීම කල හැකිය.**

වැඩිදුර විමර්ශන සම්බන්ධ ආරම්භයක් වශයෙන් **මිනිස් ජාවාරම් දර්ශක** භාවිතයෙන් හඳුනාගැනීමේ ක්‍රියාවලියට උපකාර ලබාගත හැකිය. වෘත්තීකයන් මෙන්ම විශේෂඥයන් නොවන අය හට මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනා ගැනීම සඳහා විවිධ සූරාකෑම් ආකාර ඇතුළු සාම්පල දර්ශකයන් ලැයිස්තුවක් මාර්ගෝපදේශය මගින් යෝජනා කෙරේ. විශේෂඥයන් නොවන අය ඇතුළු පාර්ශවකරුවන් හට ඔවුන් විසින් මුහුණදිය හැකි අවස්ථාවලට අවශ්‍ය මාර්ගෝපදේශ ලබාදීම සඳහා දර්ශකයන් යාවත්කාලීන කිරීමට, අනුවර්තනය කිරීමට සහ මැන බැලීමට රාජ්‍යයන් උනන්දු කෙරේ.

මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගැනීමේ මූලික වගකීම රාජ්‍යයන් සතුවුවද, හඳුනාගැනීමේ ක්‍රියාවලියේදී **රාජ්‍ය නොවන සංවිධාන සහ සිවිල් සමාජ සංවිධාන** ඉතා අගනා සේවයක් ඉටු කරයි. එම නිසා ගොදුරුවූවන් සහ අධිකාරීන් අතර විශ්වාසය ගොඩනැගීමේදී ඔවුන් විසින් ඉටුකල හැකි තීරණාත්මක කාර්යභාරය සම්බන්ධයෙන් ඔවුනට සහයෝගය ලබාදිය යුතුය. නීතිය බලාත්මක කරන, දේශසීමා, සංක්‍රමණ, ශ්‍රම පාලන, සහ සමාජ සේවා ආදී කටයුතුවලට සම්බන්ධවන නිලධාරීන් ඇතුළු රජයේ මුල්පෙලේ අධිකාරීන් හට ගොදුරුවූ අය බවට පූර්වානුමාන කරන අයව ඔවුන්ගේ පුද්ගලික ගතිලක්ෂණ සැලකිල්ලට ගෙන ඔවුන්ගේ පුද්ගලිකත්වයට ගරු කරන ආකාරයට හඳුනා ගැනීම සඳහා නිසි ලෙස පුහුණුව ලබාදිය යුතුය. මෙම සංසිද්ධිය සම්බන්ධයෙන් ප්‍රජා සාමාජිකයින්වද දැනුවත් කල යුතු අතර ඔවුන්ව හඳුනාගන්නා ආකාරය සහ ඔවුන්ව නිසි අධිකාරීන් හට යොමු කරන ආකාරය දැනගත යුතුය.

# 1 වන කොටස:

## මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හඳුනාගැනීම සම්බන්ධ හැඳින්වීමක්

### 1.1. මිනිස් ජාවාරමට ගොදුරුවූ අයකු යනු කවරෙකුද?

මිනිස් ජාවාරම යනු විවිධ ආකාරවලින් ඇති, කලාපය පුරා විවිධ ගතිලක්‍ෂණ පෙන්වන නීතිවිරෝධී දෙයකි. කෘෂිකර්මය, ඉදිකිරීම්, රැකවරණ සහ සත්කාර, ගෘහස්ථ වැඩ, විනෝද සහ ක්‍රීඩා, වන විද්‍යාව, මසුන් ඇල්ලීම, පතල් කර්මාන්තය, සහ පේෂ කර්මාන්තය ඇතුළු කර්මාන්ත රාශියක කාන්තාවන්, මිනිසුන් සහ දරුවන්ව සූරාකෑමට ලක්වේ. මිනිසුන් ජාත්‍යන්තර දේශසීමා ඔස්සේ හෝ සිය රට තුල එහා මොහා යනවිට සූරාකෑමට ලක්විය හැකිය. මිනිස් ජාවාරමට මිනිසුන් ගොදුරුවීමට බොහෝ සාධක හේතුවුවද, ගොදුරුවීමට විශේෂයෙන් ලක්විය හැකි කණ්ඩායම් අතර ලේඛණගත නොවුණු සංක්‍රමණිකයන්, වාර්ගික සුළුතරයන්, සහ දෙමාපියන් නොමැතිව පැමිණෙන දරුවන් ඇතුලත්වේ. මිනිස් ජාවාරමට ගොදුරුවීමට සහ එයට ගොදුරුවීම වැඩිවීම සම්බන්ධ අමතර සාධක ලෙස දුගීබව, විරැකියාව, ලිංගික අසමානතාවය, අධ්‍යාපන අවස්ථාවන් සහ සම්පත් සඳහා ප්‍රවේශය මදකම, සහ ක්‍රමානුකූල ලෙස උපත් ලියාපදිංචිය නොමැතිවීම දැක්විය හැකිය.

සිය වයස, ලිංගය, ස්ත්‍රී පුරුෂබව, ලිංගික හැඩගැස්ම, ජාතිය, වාර්ගික හෝ සමාජ සම්භවය, ආබාධිතබව, හෝ අවස්ථානුගත කරුණු නොසලකා ඕනෑම අයෙකු මිනිස් ජාවාරමට ගොදුරුවිය හැකිය. මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු යනු, ඉතාම සරලව, මිනිස් ජාවාරම යන අපරාධයට ලක්වුණු පුද්ගලයෙකි. ***ජාතීන් ඔස්සේ සංවිධානයවූ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තියට උපකාර ලබාදෙන විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් අදාල මිනිසුන් ජාවාරම් කිරීම වැළැක්වීම, මර්ධනය කිරීම සහ දඬුවම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලයේ*** **(මිනිසුන් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලය) 1.2 වගන්තිය මගින් දක්වා ඇති ආකාරයට මිනිසුන් ජාවාරම්කිරීම සඳහා ජාත්‍යන්තර අර්ථකථනයක් ලබාදී ඇත.**

ප්‍රායෝගිකව, එවැනි අපරාධයකට ගොදුරුවූ අයෙකුව හඳුනා ගැනීම සැමවිටම පහසු නොවේ. බාධක අතර භාෂාව සහ සංස්කෘතියට අදාල සන්නිවේදන අභියෝග සහ විශේෂයෙන් මුලින්ම හමුවූ අවස්ථාවේ විශ්වාසය නොමැතිකම හේතුවෙන් ගොදුරුවූ අය විසින් අධිකාරීන් වෙත කථා කිරීමට ඇති අකමැත්ත ඇත. ඔවුන්ගේ අත්දැකීම් අනුව, ඔවුන්ව මිනිස් ජාවාරමට ලක්වූ බව හෝ සූරාකෑමට ලක්වූ බව සලකන්නේ නොමැති විය හැකිය. ඔවුන්ගේ කැමැත්ත ලබා ගැනීමට අයුතු බලපෑම, තර්ජන හෝ රැවටීම කල තිබුණද, සමහරු මේ සඳහා ඔවුන් එකඟවුණු බව විශ්වාස කරයි. මෙම කරුණු සහ වෙනත් කරුණු හේතුවෙන් මිනිස් ජාවාරමට ලක්වූ බොහෝ අයව කිසිදිනක හඳුනා නොගනී.

> **හෝඩුවාව: මිනිස් ජාවාරමට ගොදුරුවූ බවට පූර්වානුමාන කරන අයට වාසි වන ආකාරයට පූර්වානුමිතියක් හඳුන්වාදීම**
>
> ගොදුරුවූ අය හඳුනාගැනීම සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්ති මගින් මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු වශයෙන් සැක කරන අයෙකු හට මූලික උපකාර සහ ආරක්‍ෂාව සැපයීමේ අරමුණ සම්බන්ධයෙන් ඔවුන් මිනිස් ජාවාරමට ලක්වූ අයෙකු යන පූර්වානුමිතිය මත අධිකාරීන් හට කටයුතු කිරීමට ඉඩකඩ ලබදිය යුතුය.

මිනිස් ජාවාරමට ලක්වුණු අයෙකු එවැනි තත්වයක සිටීම මගින් එවැනි පුද්ගලයෙකු මිනිස් ජාවාරමට ලක්වූ අයෙකු වශයෙන් පූර්වානුමාන කිරීම හොඳ පුරුද්දකි. මෙවැනි පූර්වානුමිතියක් අදාල කර ගැනීම මගින් අදහස් වන්නේ යම් අයෙකු මිනිස් ජාවාරමට ලක්වූ අයෙකු වශයෙන් සැකයක් ඇති අවස්ථාවක, අධිකාරීන් මගින් ඔහු හෝ ඇය අය හට උපකාර සහ ආරක්‍ෂාව අවශ්‍ය අය වශයෙන් සලකනු ලැබීමයි. පසු අවස්ථාවක එම පුද්ගලයා මිනිස් ජාවාරමට ලක් නොවූ අයෙකු වශයෙන් තීරණය කරනු ලැබුවහොත් සහ උපකාර සහ ආරක්‍ෂාව අනවශ්‍ය නම්, එම අවස්ථාවේදී එම උපකර ඉල්ලා අස්කර ගත හැකිය. මිනිස් ජාවාරමට ලක්වූ අයෙකුගේ ලක්‍ෂණ පෙන්වන අයෙකු ශාරීරික හෝ ලිංගික අඩන්තේට්ටම් වැනි වෙනත් අපරාධවලටද ලක්වූ අයෙකු විය හැකිය. යම් අයෙකු මිනිස් ජාවාරමට නොව වෙනත් අපරාධයකට ලක්වූ අයෙකු බව නිර්ණය කලහොත්, ඔහුව හෝ ඇයව වඩාත් උචිත උපකාර සේවා වෙත මාරුකල හැකිය. මිනිස් ජාවාරමට ලක්වූ අය සිය උපන් රටින් පිටව සිටිය හැකි අතර සිය රටෙහිදී ජාතිය, ආගම, ජාතිකත්වය, යම් සමාජ කණ්ඩායමක හෝ දේශපාලන මතයක සාමාජිකයෙකු වීම හේතුවෙන් හිංසාවකට ලක්වීමේ සම්බන්ධයෙන් හොඳින් පදනම්වූ බියක් තිබිය හැකිය. එවැනි අවස්ථාවලදී, ඔවුන්ව සරණාගත ක්‍රියාවලිය වෙත යොමුකල යුතුය.

1 මෙම ලියවිල්ල පුරා මිනිස් ජාවාරම යන්න සඳහන් කරන්නේ ***ජාතීන් ඔස්සේ සංවිධානයවූ අපරාධ සම්බන්ධ එක්සත් ජාතීන්ගේ ප්‍රඥාප්තියට උපකාර ලබාදෙන විශේෂයෙන් කාන්තාවන් සහ ළමුන් අදාල මිනිසුන් ජාවාරම් කිරීම වැළැක්වීම, මර්ධනය කිරීම සහ දඬුවම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලයේ (මිනිසුන් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලය) 3වන වගන්තියේ අර්ථ දක්වා ඇති ආකාරයට මිනිසුන් ජාවාරම් කිරීම යන්න දැක්වීම සඳහාය.***

## හෝඩුවාව: මිනිස් ජාවාරමට අදාල අපරාධ සම්බන්ධ අවබෝධය ඇතිකිරීම

මිනිස් ජාවාරමට ගොදුරුවූ ලෙස සලකනු නොලබන එහෙත් වෙනත් අපරාධවලට ගොදුරුවූ අයහට උපකාර සහ ආරක්ෂාක විධිවිධාන අවශ්‍ය විය හැකිය. මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගැනීම සම්බන්ධයෙන් වගකීම ඇති වෘත්තීකයන් හට ආශ්‍රිත අපරාධ සම්බන්ධයෙන් දැනුවත් කල යුතු අතර අවශ්‍ය ආකාරයට ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ට අවශ්‍ය දේ ලබා දිය යුතුය.

මිනිස් ජාවාරම අත්දකින ලද අය අපරාධයකට ගොදුරුවූ අය බැවින් රාජ්‍යයන් මගින් ඒ ආකාරයට සැලකිය යුතු අතර අදාල ආකාරයට ආරක්ෂාව ලබාදිය යුතුය. අපරාධවලට ගොදුරුවූ අය වීමට අමතරව, මිනිස් ජාවාරමට ලක්වූ අය ශාරීරික හා මානසික හානි, මානසික වධවේදනා, ලැජ්ජාවට පත්වීම හෝ කැළැල්වීම, සහ ආර්ථික හානි ඇතුළු ඔවුන්ගේ මානව හිමිකම් සහ වෙනත් හානිද සම්බන්ධ අත්දැකීම් විඳ තිබිය හැකිය.

මිනිස් ජාවාරම්කරුවෙකුව හඳුනාගෙන ඇතිද, අත්අඩංගුවට ගෙන ඇතිද, නඩු දමා ඇතිද නැතිනම් වරදකරු කර ඇතිද යන්න සහ හානියට ලක්වූ අය සහ මිනිස් ජාවාරම කල බව කියන අය අතර පවුල් සම්බන්ධතාවයක් තිබුණද යන්න නොසලකා යම් අයෙකු මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු බවට සැලකිය යුතුය.

1 වන වගුව: හානියට ලක්වූ අයව හඳුනාගැනීම සම්බන්ධ මිත්‍යා මත සහ ඇත්ත තත්වය [2]

| මිථ්‍යාව | ඇත්ත තත්වය | වැඩිදුර විස්තර සඳහා බලන්න: |
|---|---|---|
| මිනිස් ජාවාරමට ලකවූ අය ලෙස සැලකීමට ජාත්‍යන්තර දේශසීමා ඔස්සේ යා යුතුය. | බොහෝ අයව මිනිස් ජාවාරමට ලක්කරන්නේ ජාත්‍යන්තර දේශසීමා ඔස්සේ වුවද, රටක දේශසීමා ඇතුලත වුවද මිනිස් ජාවාරම සිදුවිය හැකිය. මෙය අභ්‍යන්තර (ගෘහස්ථ) මිනිස් ජාවාරම ලෙස හඳුන්වයි. | *1.2 මානව හිමිකම් අර්ථ දැක්වීම* |
| මිනිස් ජාවාරමට ලක්විය හැක්කේ කාන්තාවන් සහ ළමුන් පමණි. | මිනිස් ජාවාරම සම්බන්ධ බොහෝ පර්යේෂණ සහ මාධ්‍ය ආවරණය ඇත්තේ කාන්තාවන් සහ ළමුන් මිනිස් ජාවාරමට ලක් කිරීම සම්බන්ධයෙනි. කෙසේවුවද මිනිසුන්වද, බලෙන් ශ්‍රමය ලබාගැනීම ඇතුළුව, සියළු ආකාරයේ සූරාකෑම්වලට ඔවුන්ව ලක්වේ. | *1.2 මානව හිමිකම් අර්ථ දැක්වීම*<br>*1.3 සූරාකෑමේ ආකාර අවබෝධ කර ගැනීම* |
| සියළුම මිනිස් ජාවාරමට ලක්වූ අය එසේ කරනන්නේ ලිංගික වශයෙන් සූරාකෑම සඳහාය. | මිනිස් ජාවාරමට ලක්වීම සම්බන්ධ වැඩිපුර ප්‍රමාණයක් ලිංගික වශයෙන් සූරාකෑම සඳහා වුවද, බලෙන් ශ්‍රමය ලබා ගැනීම, වහල්භාවය, හෝ වහල්භාවය හා සමාන වෙනත් පුහුණු, පරවශතා, ඉන්ද්‍රියයන් ඉවත් කිරීම සහ වෙනත් ආකාරයේ සූරාකෑම් සඳහාද මිනිසුන්ව ජාවාරම් කල හැකිය. | *1.3 සූරාකෑමේ ආකාර අවබෝධ කර ගැනීම* |

2 මෙම වගුවේ ඇති කරුණු සම්බන්ධ වැඩිදුර විස්තර පහත ස්ථානවලින් ලබාගත හැකිය: *Global Report on Trafficking in Persons*, UNODC, 2014; *ILO Global Estimate of Forced Labour 2012: Results and Methodology,* ILO, 2012; *Trafficking in Persons Report 2014*, United States Government, Department of State, Office to Monitor and Combat Trafficking in Persons, 2014.

| | | |
|---|---|---|
| ලිංගික කර්මාන්තයේ කටයුතු කරන සියළුම අය මිනිස් ජාවාරමට ගොදුරුවූ අයවේ. | ලිංගික සූරාකෑම සඳහා කරන මිනිස් ජාවාරම මිනිස් ජාවාරමේ වඩා බහුල සහ හොඳින් පෙනෙන ආකාරයක් වුවද, ලිංගික කර්මාන්තයේ යෙදෙන සියළුම අය අවශ්‍යයෙන්ම මිනිස් ජාවාරමට ලක්වූ අය නොවේ. ලිංගික සූරාකෑම සඳහා යම් අයෙකු මිනිස් ජාවාරමට ලක්කලේ නම්, බලහත්කාරය, තර්ජනය, රැවටීම වැනි තහනම් දෙයක් භාවිතා කර තිබිය යුතුය. | *1.3 සූරාකෑමේ ආකාර අවබෝධ කර ගැනීම*<br><br>*3.3. මිනිස් ජාවාරමේ දර්ශක* |
| සියළුම ලේඛණගත නොකල සංක්‍රමණිකයන් මිනිස් ජාවාරමට ලක්වූ අයවේ. විදිමත් තත්ව යටතේ සිටින සංක්‍රමණිකයන් මිනිස් ජාවාරමට ලක්වූ අය විය නොහැකිය. | මිනිසුන්ව සූරාකෑමට ලක්කරන ආකාරයට රටට ගෙන ආවාද, රටකට අවිධිමත් ලෙස ඇතුළුවන සියළුම අය සූරාකෑමට ලක්වූ අය නොවේ. තවද, රටකට විධිමත් මාර්ගවලින් ඇතුළුවී රැඳී සිටින අය වුවද මිනිස් ජාවාරමට ලක්වූ අය විය හැකිය. | *1.2. මානව හිමිකම් අර්ථ දැක්වීම*<br><br>*2.2 මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගැනීමේදී ඇති අභියෝගයන් හඳුනාගැනීම සහ අවශ්‍ය කටයුතු කිරීම*<br><br>*3.3.මිනිස් ජාවාරමේ දර්ශක* |
| සිය තත්වය සම්බන්ධයෙන් දන්නා හෝ ඒ සඳහා කැමැත්ත දී ඇති බව පෙනෙන අය මිනිස් ජාවාරමට ලක්වූ අය ලෙස සැලකිය නොහැක. | යම් පුද්ගලයෙකු තමාගේ තත්වය පිළිගන්නා බව පෙනුනද, නැතිනම් තත්වයන් (උදා. රැකියාව) හට මුල සිටම කැමැත්ත දී තිබුණද, ඔහු හෝ ඇය තව දුරටත් මිනිස් ජාවාරමට ලක්වූ අයෙකු විය හැකිය. දරුවෙකුගේ කැමැත්ත සැමවිටම අදාල නොවන අතරම අයුතු බලපෑම, තර්ජනය හෝ රැවටීම වැනි තහනම් ක්‍රම භාවිතා කර කැමැත්ත ලබාගත්තේ නම්, වැඩිහිටියෙකුගේ කැමැත්තද අදාල නොවේ. | *1.2. මානව හිමිකම් අර්ථ දැක්වීම*<br><br>*3.3. මිනිස් ජාවාරමේ දර්ශක* |
| නෑකමක් ඇති හෝ සම්බන්ධතාවයක සිටින අයව මිනිස් ජාවාරමට ලක්වූ අය ලෙස සැලකිය නොහැකිය. | බොහෝවිට මිනිස් ජාවාරම් තත්වයකට යම් අයෙකුව රැග ගෙන යන්නේ මිතුරෙකු හෝ නෑයෙකු විසිනි. මිනිස් ජාවාරම් කරන අය සිය ගොදුරු පාලනය කිරීමේ ආකාරයක් ලෙස විවාහය සහ වෙනත් සමීප සම්බන්ධතාද උපකාර කරගනී.[3] | *3.3. මිනිස් ජාවාරමේ දර්ශක* |
| පෙර අවස්ථාවට වඩා පසුව තමුන්ගේ ජීවිතය වඩා පහසුවෙන් හෝ ආර්ථික වශයෙන් වඩා හොඳ තත්වයක ඇති බව මිනිසුන් විශ්වාස කිරීම හේතුවෙන් ඔවුන් මිනිස් ජාවාරමට ගොදුරුවූ අය ලෙස සැලකිය නොහැක. | යම් අයෙකු ඔවුන්ව මිනිස් ජාවාරම් කිරීමට පෙර ඉපයූ මුදලට වඩා වැඩි මුදලක් හිමිබ කිරීම සහ/හෝ වඩා පහසු ජීවිතයක් තිබුණද, ඔවුන් තව දුරටත් මිනිස් ජාවාරමට ගොදුරුවූ අය විය හැකිය. සූරාකෑම මනෝමූලිකව ඇගයිය යුතුය. | *2.2. මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගැනීමේදී ඇති අභියෝගයන් හඳුනාගැනීම සහ අවශ්‍ය කටයුතු කිරීම*<br><br>*3.3. මිනිස් ජාවාරමේ දර්ශක* |

3 1.3 කොටසේ සාකච්ඡා කල ආකාරයට, වහල්භාවය හා සමාන වෙනත් පුහුණු යන්න නිර්වචනය කර ඇත්තේ 1956 *Supplementary Convention on the Abolition of Slavery, the Slave Trade, and Institutions and Practices Similar to Slavery* (Supplementary Convention) හිය.


## 1.2. මිනිස් ජාවාරම අර්ථ නිරූපණය

මිනිස් ජාවාරම සම්බන්ධ ප්‍රොටොකෝලයේ ප්‍රකාශිත අරමුණක් වන්නේ මිනිස් ජාවාරමට ලක්වන අය ඔවුන්ගේ මානව හිමිකම්වලට පූර්ණ ගරුත්වය ඇතිව ආරක්ෂාකර උපකාර කිරීමවේ.[4] මෙම අරමුණ මගින් රාජ්‍යයන් විසින් එවැනි උපකාර සහ ආරක්ෂාව අවශ්‍ය මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගැනීමට අනුමිත අවශ්‍යතාවයක් ඇති කරයි. රාජ්‍ය අධිකාරීන් හට මිනිස් ජාවාරමට ගොදුරුවන අයෙකුව හඳුනාගැනීම සඳහා අපරාධයේ නෛතික අර්ථ දැක්වීම අනුව මිනිස් ජාවාරම කුමක්ද යන්න අවබෝධ කර ගැනීමට අවශ්‍යවේ. ජාත්‍යන්තර නීතියේ, අපරාධයේ අර්ථදැක්වීම මිනිසුන් ජාවාරම් කිරීමට සම්බන්ධ ප්‍රොටෝකෝලයේ 3 (අ) වගන්තියෙහි ඇත.

> *මිනිසුන් ජාවාරම් කිරීම යනුවෙන් අදහස් වන්නේ සූරාකෑමේ අරමුණු වෙනුවෙන් මිනිසුන්ට තර්ජනය හෝ වෙනත් ආකාරයේ බලය හෝ වෙනත් අකාරයේ අයුතු බලපෑම් හෝ අපහරණය හෝ වංචාව හෝ රැවටීම හෝ බලය අනිසි ලෙස භාවිතා කිරීම හෝ දුර්වල තත්වයක් භාවිතා කරමින් හෝ ගෙවීමක් හෝ ප්‍රතිලාභයක් ලබාදීම හෝ ලබා ගැනීම සඳහා යම් අයෙකු සේවයේ යොදවා ගැනීම, ප්‍රවාහණය, මාරු කිරීම, ලග තබා ගැනීම හෝ ලබා ගැනීම සඳහා යම් කිසි පුද්ගලයෙකු සම්බන්ධයෙන් බලපෑම් කල හැකි වෙනත් පුද්ගලයෙකුගේ කැමැත්ත ලබාගැනීමවේ. සූරාකෑම අතරට, අවම වශයෙන්, වෙනත් අයව ගණිකා වෘත්තිය හෝ වෙනත් ලිංගික සූරාකෑම් සම්බන්ධ සූරාකෑමට ලක්කිරීම, බල ලෙන් ශ්‍රමය හෝ සේවා ලබා ගැනීම, වහල්බව හෝ ඒ හා සමාන පුහුණු, පරවශතාව හෝ ඉන්ද්‍රියයන් ඉවත් කිරීම ඇතුලත්වේ.*

පහත ඇති 1 වන රැපය මගින් වැඩිහිටි අයව මිනිස් ජාවාරමට ලක් කිරීමේ අපරාධයක තිබිය යුතු මූලික අංග තුන දක්වා ඇත. මිනිස් ජාවාරම ස්ථාපනය කිරීමට එක් එක් තීරයේ අති දෙයින් එකක් හෝ තිබිය යුතුය.

1 වන රූපය: මිනිසුන්ව ජාවාරම් කිරීමේ ජාත්‍යන්තර නෛතික අර්ථදැක්වීමේ මූලික අංග:[5]




4 Trafficking in Persons Protocol හි 2 (ආ) වගන්තිය බලන්න.

5 මූලාශ්‍රය: *Policy Guide on Criminalizing Trafficking in Persons, Bali Process,* සම්බන්ධ ප්‍රතිපත්ති මාර්ගෝපදේශය, 5 වන පිටුව.

ප්‍රොටොකෝලයේ 3 (ආ) වගන්තිය මගින් දක්වන්නේ නියම කරන ලද ආකාරයේ බලය භාවිතා කර ඇති අවස්ථාවල මිනිස් ජාවාරමට ගොදුරුවූ අයගේ කැමැත්ත අර්ථ විරහිත වන බවයි. ප්‍රොටොකෝලයේ 3 (ඇ) සහ (ඈ) වගන්තිය මගින් දක්වන්නේ ගොදුරුවූ අය වයස අවුරුදු 18ට අඩු දරුවකු වන අවස්ථාවල නියම කරන ලද ආකාර ඔප්පු කල යුතු නොවන බවයි.[6]

ප්‍රොටොකෝලය මිනිස් ජාවාරම සම්බන්ධයෙන් කටයුතු කරන පළමුවන ජාත්‍යන්තර ලේඛණය නොවුනද, ඒ මගින් අදවන විට ලබාදී ඇති වඩාත්ම හොඳ අර්ථ නිරූපණය ලබාදී ඇති අතර රාජ්‍යයන් මගින් ජාතික නීතියේ අපරාධ සම්බන්ධයෙන් අර්ථ නිරූපන ලබාදීමට සඳහා විශ්වාසය තබන ප්‍රාථමික ජාත්‍යන්තර ලියවිල්ල මෙයවේ. 3 වන වගන්තියේ ඇති අර්ථ නිරූපණය මගින් පිරිමින් සහ ළමුන්ද මිනිස් ජාවාරමට ගොදුරුවිය හැකි බව සහ  සූරාකෑමට ලිංගික සූරාකෑම පමණක් නොව වෙනත් ආකාරයේ සූරාකෑම්ද ඇතුලත් වන්නේය යන අවබෝධය සම්මතයක් කිරීම සඳහා උපකාරවී ඇත.[7] අර්ථ නිරූපනයේ ඇතුලත්කර ඇති සූරාකෑමේ ආකාරවලට පරවශතා සහ ඉන්ද්‍රියයන් ඉවත් කිරීම මෙන්ම බලෙන් ශ්‍රමය ෙ හා සේවා ලබා ගැනීම, සහ වහල්බව හෝ වහල්බව හා සමාන පුහුණු ඇතුලත්වේ. මෙම ලැයිස්තුව මගින් සූරාකෑම කරන ආකාරයේ සැලකිය යුතු අවම සම්මතයන් දක්වන අතර එය සම්පූර්ණ ලැයිස්තුවක් නොවන අතර මේ හේතුව නිසා අර්ථ නිරූපණයට සුනම්‍යතාවයක් ලබාදෙන අතර නව සූරාකෑම් අනුව එය අනුවර්තනය කල හැකිය.

මිනිස් ජාවාරම සම්බන්ධ අන්තර්ජාතික අර්ථ නිරූපණය නිර්වචනය කරන විවිධ ආකාර ඇත. සමහර ප්‍රවේශයන්ට අනුව සූරාකෑම පසෙක තබා, මිනිස් ජාවාරම සලකනු ලබන්නේ ගොදුරුවන අයෙකු සූරාකෑම වෙත ලබාදෙන ක්‍රියාවලිය ("සේවයේ යොදවා ගැනීම, ප්‍රවාහණය කිරීම, මාරුකර යැවීම, ළඟ තබා ගැනීම, හෝ ලබා ගැනීම") වශයෙන් වන අතර, වෙනත් අය අවබෝධකර ගන්නා ආකාරයට අපරාධය තුල ක්‍රියාවලිය සහ අවසාන ප්‍රතිඵලය ("සූරාකෑම") යන දෙකම ඇත. උදාහරණ වශයෙන්, දැඩි ඍජු අර්ථනිරූපණයක් මගින් එහාමෙහා ගෙනයාම මිනිස් ජාවාරමට අදාල නැති අතර එහා මෙහා ගෙනයාම මිනිස් ජාවාරමට සම්බන්ධ නොකර, මිනිස් ජාවාරම ඉහතින් සඳහන් කල ජාත්‍යන්තර නීතියේ වෙනත් ස්ථානවල අර්ථනිරූපණය කර ඇති බලෙන් ශ්‍රමය ලබා ගැනීම වැනි සූරාකෑම්වලින් වෙන්කර දැක්වීම අපහසුවේ. තවද, ජාතික නීතීන් මගින් පැහැදිලිව හඳුනාගන්නා සූරාකෑමේ ආකාර රාජ්‍යයෙන් රාජ්‍යයට වෙනස්වේ.

ජාත්‍යන්තර නීතියේ මිනිස් ජාවාරම සහ සංක්‍රමණිකයන් ජාවාරම් කිරීම සම්බන්ධ නීත්‍යානුකූල වශයෙන් වෙනසක් ඇත.[8] ප්‍රායෝගික වශයෙන්, විශේෂයෙන් රාජ්‍යයන් අතර මිනිස් ජාවාරම සිදුවන විට, මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකුව ජාවාරම් මෙහෙයුමකට ලක්වන සංක්‍රමණිකයෙකු අතර වෙනස හඳුනා ගැනීමට අපහුවේ, හේතුව එම පුද්ගලයා ජාවාරමට ලක්වූ සංක්‍රමණිකයෙකු මෙන්ම මිනිස් ජාවාරමට ලක්වූ අයෙකුද විය හැකි බැවිනි.[9] මිනිස් ජාවාරම සිදුවන ගමනේදී හෝ අවසන් රට බලා ළඟාවූ විට ජාවාරමට ලක්වූ සංක්‍රමණිකයන් මිනිස් ජාවාරම්කරුවන්ට හෝ වෙනත් ආකාරයේ සූරාකෑම්වලට ලක්වීමට බොහෝ ඉඩකඩ ඇත. වරද කරන අය එක් මෙහෙයුමකදී, කණ්ඩායමක සාමාජිකයන් ජාවාරමට ලක්කරන අතර අනෙක් අයව මිනිස් ජාවාරම කරමින් සිටි අපරාධ දෙකම සිදුකරනවා විය හැකිය.

## හෝඩුවාවඃ දුර්වල කණ්ඩායම් අතර සිටින මිනිස් ජාවාරමට ලක්වූ ලෙස පූර්වානුමාන කල අයව හඳුනා ගැනීම

යොයාබැලීමේ අදියරට පෙර, මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගැනීම අතිශය දුෂ්කරවේ. සිය ප්‍රතිපත්ති අතරට මිනිස් ජාවාරමට ලක්කල සංක්‍රමණිකයන් ඇතුළු, මිනිස් ජාවාරමට ලක්විය හැකි අය අතර සිටින පූර්වානුමාන කල ගොදුරුවූ අය හඳුනා ගැනීමට අධිකාරීන් හට උපකාර කරන ප්‍රතිපාදන තිබිය යුතුය.

මිනිස් ජාවාරමට ලක්වූ සංක්‍රමණිකයන්, සංක්‍රමණිකයන්ව ජාවාරම් කරන අය සමග ස්වේච්ඡාවෙන් වැඩපිළිවෙලවල්වලට ඇතුළුවිය හැකි අතර, මිනිස් ජාවාරම, සූරාකෑම සහ වෙනත් අපරාධවලට (බලෙන් ලබා ගැනීම, අයුතු අපහරණය, ලිංගික අතවර, ස්ත්‍රී දූෂණය හෝ වධහිංසා කිරීම ඇතුළු) ලක්වීමට බොහෝසේ ඉඩකඩ ඇත.  මිනිස් ජාවාරමේදී යන ගමනේ තත්වය ඉතාම කටුක වන බැවින් මිනිස් ජාවාරමට ලක්වීමට කලින් ගත් තීරණය  තවදුරටත් අර්ථසහගත නොවනු ඇත.[10]

6 *Policy Guide on Criminalizing Trafficking in Persons, Bali Process*, 2014, පිටු 4-5 ද බලන්න.

7 1904,1910 සහ 1933 ජාත්‍යන්තර සම්මුතීන් ගණිකා වෘත්තීය සඳහා කාන්තාවන් සහ ගැහැණු ළමුන්ව ජාත්‍යන්තර දේශසීමා ඔස්සේ රැගෙනයාම සම්බන්ධ පුහුණුවට වැඩි අවධානය ලබා දී ඇති අතර 1949 Convention for the Suppression of the Traffic in Persons and of the Exploitation of the Prostitution of Others මගින් මෙය කාන්තාවන් සහ ගැහැණු ළමුන්ගෙන් ඔබ්බට ගොස් ඕනෑම අයෙකු ඇතුලත් කරන ලදී. අත්‍යාවශ්‍ය ලෙස ලිංගික ක්‍රියාවලට සම්බන්ධ නොවන සූරාකෑම් අකාර ඇතුලත් කිරීම සම්බන්ධ අවධානය ලක්කරන පළමුවන මිනිස් ජාවාරම් සම්බන්ධ ජාත්‍යන්තර ලියවිල්ල පැලමෝ ප්‍රොටෝකෝලයවේ.

8  *United Nations Convention against Transnational Organized Crime* හට ඌණපූරණ සපයන *Protocol against the Smuggling of Migrants by Land, Sea and Air* ප්‍රොටොකෝලයේ 3 වන වගන්තියට අනුව සංක්‍රමණිකයන්ව ජාවාරම් කිරීම යනු මූල්‍යමය හෝ වෙනත් ද්‍රව්‍යමය වාසියක් ලබා ගැනීමේ අරමුණින් අදාල පුද්ගලයා පුරවැසියෙකු හෝ ස්ථිර නේවාසිකයෙකු නොවන රටකට නීතිවිරෝධී ආකාරයට ඇතුළුකිරීම සඳහා කටයුතු කිරීමවේ.

9 මිනිස් ජාවාරම සහ සංක්‍රමණිකයන් ජාවාරම් කිරීම සම්බන්ධ සවිස්තරාත්මක සාකච්ඡාවක් සඳහා බලන්න *Policy Guide on Criminalizing Trafficking in Persons, Bali Process*, 2014, pp.8-9 and *Policy Guide on Criminalizing Migrant Smuggling, Bali Process,* 2014, හි 9-10 පිටු.

10 උදාහරණ වශයෙන්, සංක්‍රමණිකයන් ගමනේ යෙදෙන විට ඔවුන් මුහුණ දෙන දරුණු තත්වය නොසලකා ඔවුන් හට තමාව මිනිස් ජාවාරමට ලක්කරන අය සමග සිටිනවාට වඩා වැඩි දෙයක් කිරීමට නොහැකි අතර එම ගමන දිගටම යාමට සිදුවේ. මෙම තත්වයන් සොයා ගත් අවස්ථාව අනුව, අදාල පුද්ගලයන් මිනිස් ජාවාරමට ගොදුරුවූ අය ලෙස සලකනවාට වඩා මිනිස් ජාවාරමට ලක්වූ සංක්‍රමණිකයන් ලෙස සැලකිය හැකිය. මිනිස් ජාවාරම නම්වූ අපරාධය සිදුවීමට සූරාකෑමේ අරමුණක් තිබිය යුතු නමුත්, ඒ බව සොයා ගන්නේ සූරාකෑම සිදුවී අවසාන වුණු පසුය. මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව හඳුනාගන්නා බවට වග බලා ගැනීම සඳහා ජාවාරමට ලක්වූ සංක්‍රමණිකයන් අතර මිනිස් ජාවාරමට ලක්වුණු දර්ශක ඇතිද යන්න අධිකාරීන් විසින් සොයා බැලිය යුතුය.

## 1.3. විවිධ ආකාරයේ සූරාකෑම් අවබෝධකර ගැනීම

බොහෝ මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගනු ලබන්නේ ඔවුන්ව සූරාකෑමට ලක්වූ පසුව බැවින් විවිධ ආකාරයේ සූරාකෑම් ජාත්‍යන්තර නීතියේ නිර්වචනය කර ඇති ආකාරයට හඳුනාගැනීම වැදගත්වේ. මිනිස් ජාවාරම් කළ බවට පූර්වානුමිතියක් ඇතිකර ගැනීම සඳහා සූරාකෑම සම්බන්ධ සාක්ෂි විශේෂයෙන් වැදගත්වේ.

බොහෝ රටවල, ලිංගික සූරාකෑමේ අරමුණ වෙනුවෙන් මිනිස් ජාවාරම සිදුකිරීම සම්බන්ධයෙන් සැලකියයුතු අවධානමක් යොමුකර ඇත. කාන්තාවන් සහ ළමුන්ව ලිංගික වශයෙන් සූරාකෑමට ලක්කිරීම ලොව පුරාම සැලකිය යුතු ගැටළුවක් වුවද, වෙනත් ආකාරයේ සූරාකෑම්ද අවබෝධ කර ගැනීම වැදගත්වේ.

### බලෙන් ශ්‍රමය හෝ සේවා ලබා ගැනීම

*1930 ජාත්‍යන්තර කම්කරු සංවිධානයේ (ILO) බලෙන් ශ්‍රමය ලබාගැනීම සම්බන්ධ ප්‍රඥප්තියට* අනුව, **'**බලෙන් ශ්‍රමය හෝ සේවා ලබා ගැනීම**'** යනු "ඕනෑම දඬුවමකට, සහ අදාල පුද්ගලයා ස්වේච්ඡාවෙන් ඉදිරිපත්වී නැති අවස්ථාවක යම් පුද්ගලයෙකුගෙන් බලෙන් ලබාගන්නා සියළුම ශ්‍රමය සහ සේවාවේ."[11] බලෙන් ලබාගැනීම යනු සේවකයන් හට උසස්වීම්, මාරුවීම්, නව රැකියා හෝ නිවාස ආදිය ලබා නොදීම වැනි **'**සේවායෝජක**'**[12] විසින් ශාරීරිකව සහ මානසිකව කරනු ලබන බලපෑම් ලෙස අර්ථ නිරූපණය කර ඇත.[13] ස්වේච්ඡාවෙන් නොවීමද බලෙන් ශ්‍රමය ලබාගැනීම හඳුනාගැනීමට තීරණාත්මක ලෙස උපකාරවේ. සේවකයා හෝ සේවිකාව නිදහසේ කැමැත්ත දී නොමැතිනම් සහ එම කැමැත්ත ඉල්ලා අස්කර ගත නොහැකි නම්, ශ්‍රමය ලබාගැනීම බලෙන් ලබාගැනීමක්වේ.

> ***ළමා ශ්‍රමයට එරෙහිව ළමුන්ගෙන් වැඩ ගැනීම***
>
> *1973 රැකියාවලට යාම සඳහාවූ අවම වයස සම්බන්ධයෙන් ජාත්‍යන්තර කම්කරු සංවිධාන ප්‍රඥප්තිය මගින් ළමා ශ්‍රමය වශයෙන් හඳුන්වන්නේ ඔහුගේ හෝ ඇයගේ සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට අනතුරුදායක, හෝ ඇයගේ හෝ ඔහුගේ අධ්‍යාපනය හෝ වෘත්තීය හැඩගැස්ම සහ පුහුණුවට බාධා පමුණුවන වයස අවුරුදු 18ට අඩු පුද්ගලයෙකු විසින් ඉටුකරන කුමන ආකාරයේ හෝ වැඩක් හෝ සේවාවක් වශයෙනි.*
> *ළමා ශ්‍රමය ළමා වැඩවලින් වෙනස්කර ගත හැක්කේ, ළමා වැඩවලදී ළමුන්ගේ සෞඛ්‍යයට හෝ ආරක්ෂාවට හෝ, ඔවුන්ගේ අධ්‍යාපනඅවස්ථාවන් හට බලපෑම් ඇති නොවීමවේ.*

---

10 Trafficking in Persons Protocol දක්වා ඇති අනිවාර්ය ආරක්ෂණ ප්‍රතිපාදන *Protocol against the Smuggling of Migrants by Land, Sea and Air* (Smuggling of Migrants Protocol) හිද ඇත.

11 The International Labour Organization (ILO) ඇති බලෙන් ශ්‍රමය ලබගැනීම සම්බන්ධ අර්ථ නිරූපණය 2014 Protocol to the Forced Labour Convention පිළිගැනීමත් සමග තවදුරටත් තහවුරු කරන ලදී. International Labour Conference, *Text of the Protocol to the Forced Labour Convention*, 1930, Provisional Record 9A, 103rd Session, Geneva, 2014, Art. 1(3).

12 ILO, *Report of the Committee of Experts on the Application of Conventions and Recommendations*, Report III (Part 1A), International Labour Conference, 90th Session, Geneva, 2002, 98 වන පිටුව.

13 *Abolition of forced labour*, General Survey by the Committee of Experts on the Application of Conventions and Recommendations, ILC, 65th Session, Geneva, 1979, para. 21 [hereafter: Abolition of forced labour, General Survey of 1979]. See also *Eradication of forced labour*, General Survey of 2007, 37 වන පරිච්ඡේදය බලන්න at para. 37.

## වහල්බව සහ වහල්බව හා සම්බන්ධ පුහුණු

මානව සුරාකෑමේ බොහෝ අන්තගාමී ආකාරය ලෙස වහල්බව සැලකේ. රාජ්‍යයන් හට කිසි දිනක මග හැරිය නොහැකි ජාත්‍යන්තර නීතියේ රීතීන් කිහිපයකින් එකක් වන්නේ වහල්භාවය සම්බන්ධයෙන් ඇති නිදහසයි. මින් අදහස් වන්නේ රාජ්‍යයන් හට කිසිදු අවස්ථානුගත තත්වයක් යටතේ වහල්භාවයට ඉඩ ලබා දිය නොහැකි බවයි. වහල්භාවය ප්‍රථම වතාවට අර්ථ නිරූපණය කරන ලද්දේ 1926 වහල් වෙළඳාම සහ වහල්භාවය මැඩපැවැත්වීම සඳහාවූ ප්‍රඥාප්තියයි ('වහල්බව සම්බන්ධ ප්‍රඥාප්තිය ලෙසද හැඳින්වේ'). එහි අර්ථනිරූපණය නම්, "*යම් පුද්ගලයෙකුගේ අයිතියට සම්බන්ධ බලය වෙනත් අයෙකු විසින් පාලනය කරන තත්වයක්*" යන්නයි.[14]. මූලය වන්නේ, වහල්භාවය යන්න 'අයිතිය හා සම්බන්ධ බලය' යන්නයි; අයිතිය හා සම්බන්ධ බලය ලෙස විග්‍රහ කරන සාම්ප්‍රදායික වහල්භාවය තත්කාලීන වහල්භාවය සම්බන්ධයෙන්ද ප්‍රමුඛස්ථානයක් ගනී. වහල්භාවයේ සමහරක් වැදගත් ලක්ෂණ අතරට ගොදුරුවන අයගේ නම, ආගම, විවාහය හෝ ලිංගික සහකරුවන් මෙන්ම සිය දරුවන්ගේ ඉරණම සම්බන්ධ අධිකාරියද ඇත.[15] වහල්භාවය මගින් ගොදුරුවන අයගේ ජීවිතය පවත්වා ගැනීම පහතට ඇද දමන හැසිරීමද අඩංගුවිය හැකිය.[16]

### හෝඩුවාව: වහල්භාවය හඳුනාගැනීම

වහල්භාවය සළකුණු කරන්නේ අපරාධය කරන අය සහ ඔහුගේ හෝ ඇයගේ අපරාධයට ලක්වූ අය අතර ඇති සම්බ-න්ධතාවයට වඩා අදාල තත්වයට සම්බන්ධ කරුණු මතය. වහල්භාවයට ලක්වූ අයෙකු පෙනෙන ආකාරයට සැපපහසු ජීවිතයක් ගත කලද, සිය ජීවිතය සම්බන්ධයෙන් මූලික තීරණ ගැනීමට ඇති නොහැකියාව අධිකාරීන් විසින් අවබෝධ කරගත යුතුය.

*වහල්භාවය හා සමාන පුහුණු, වහල්භාවය සහමුලින්ම නැතිකිරීමට ඌණපූරණ සපයන 1956 ප්‍රඥාප්තිය, වහල් වෙළඳාම, සහ ආයතන සහ වහල්භාවය හා සමාන පුහුණු* (ඌණපූරණ සපයන ප්‍රඥාප්තිය) මගින් තහනම් කර ඇත. වහල්භාවය හා සමාන ආයතන සහ පුහුණු මගින්, නීතිය මගින් නොව, චාරිත්‍ර සම්ප්‍රදායන්, හෝ සමාජ පුහුණු මගින් පවත්වාගෙන යන අයිතිය හා සම්බන්ධ අංග ඇති සුරාකෑමේ මානව සම්බන්ධතා ලෙස හඳුන්වයි. විශේෂයෙන්, ඌණපූරණ සපයන ප්‍රඥාප්තිය මගින් වහල්භාවය හා සමාන ආයතන සහ පුහුණු හඳුන්වාදේ:

- **ණයක් පියවීම සම්බන්ධයෙන් ඇති වහල්භාවය** (1(අ)) වගන්තිය, "ණයකරුවෙකු විසින් ණයක් පියවීම සඳහා තමාගේ හෝ තමාගේ පාලනය යටතේ සිටින අයෙකුගේ පුද්ගලික සේවා ලබාදීම සඳහා වන පොරොන්දුවකින් පැනනගින තත්වයකි. එම සේවාවන් සාධාරණ ලෙස ඇගයීම කලද ණය පියවීම සඳහා එවා අදාල නොවීම හෝ එම සේවාවල කාලය සහ ස්වභාවය සීමා නොවන අතර නිර්වචනය කර නැතිනම් මෙම තත්වය ඇතිවේ."[17] වෙනත් වචනවලින් කිවහොත්, ණයක් පියවීම සඳහා ඇතිවන වහල්භාවය මගින් අදහස් වන්නේ යම් පුද්ගලයෙකු විසින් ණයක් පියවීම සඳහා සපයන සේවා මගින් කිසිදිනක අදාල ණය ගෙවා අවසාන නොවන බවයි.

### හෝඩුවාව: ණයක් පියවීම සම්බන්ධයෙන් ඇතිවහල්භාවය (debt bondage)

මිනිස් ජාවාරමට ලක්වූ බොහෝ අය අතර ණයක් පියවීම සම්බන්ධයෙන් ඇති වහල්භාවය බහුල අත්දැකීමකි. ණයක් පියවීම සම්බන්ධයෙන් ඇති වහල්භාවය හඳුනාගත හැක්කේ නිර්ණය කල නොහැකි ණයක් පැවතීම සහ කොතරම් වැඩ කලත් සේවා සැපයුවත් ගෙවා අවසන් කල නොහැකිවීම හේතුවෙනි. ණයක් ගෙවීම සඳහා සුරාකන ආකාරයට ශ්‍රමය හෝ සේවා ලබාදීම හේතුවෙන් බොහෝ අධිකරණ කලාප මගින් ණයක් පියවීම සම්බන්ධයෙන් ඇති වහල්භාවය බොහෝ පුළුල් ආකාරයට හඳුනා ගනී.

14 1927 මාර්තු 9 වන දින බලාත්මක වුණු *Convention to Suppress the Slave Trade and Slavery*, 60 League of Nations Treaty Series 253, 25 September 1926, (Slavery Convention).

15 උදාහරණ වශයෙන් බලන්න, *Prosecutor v. Kunarac, Kovac and Vukovic*, Case IT-96-23-T and IT-96-23/1-T, International Criminal Tribunal for the former Yugoslavia Appeals Chamber, 12 June 2002.

16 උදාහරණ වශයෙන් බලන්න, the *Bellagio-Harvard Guidelines on the Legal Parameters of Slavery*, Research Network on the Legal Parameters of Slavery, 2012.

17 බලන්න The IOM Handbook on Direct Assistance to Victims of Trafficking, IOM, 2005, section 4.2.6

- දාසත්වය (Serfdom) 1 (ආ) වගන්තිය අනුව නීතිය, “චාරිත්‍ර හෝ එකඟතාවය මත වෙනත් අයෙකුට අයත් ඉඩමක ජීවත්වෙමින් එම පුද්ගලයා හට ප්‍රතිලාභ සඳහා හෝ එසේ නොමැතිව, සිය තත්වය වෙනස්කර ගත නොහැකිව, නිර්ණය කරන ලද සේවා ලබාදීම” සම්බන්ධ තත්වයකි.

- 1(ඇ) වගන්තිය අනුව පහත ඕනෑම ආයතනයක් හෝ පුහුණුවක්;
“*(i) කාන්තාවක්, තමා විසින් ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය නොමැතිව, සිය දෙමාපියන්, භාරකරුවන්, පවුලේ අය හෝ වෙනත් පුද්ගලයෙකුට හෝ කණ්ඩායමකට යම් මුදලක් හෝ වෙන දෙයක් ලබාදීම සම්බන්ධයෙන් විවාහ කර දීම හෝ විවාහ කර දීමට පොරොන්දුවීම; හෝ*
*(ii) ලබාගත් වටිනාකමක් හෝ වෙන දෙයක් හේතුවෙන් කාන්තාවකගේ ස්වාමිපුරුෂයා, ඔහුගේ පවුලේ අය හෝ ඔහුගේ රැලේ අය විසින් ඇයව වෙන පුද්ගලයෙකු වෙත ලබාදීම; හෝ*
*(iii) සිය ස්වාමිපුරුෂයාගේ මරණයෙන් පසු කාන්තාවක් වෙන අයෙකු වෙත ප්‍රවේණියෙන්* අයිතිවීමට යටත් වීම.

## හෝඩුවාව: බලෙන් විවාහ සිදුකිරීම හඳුනාගැනීම

කාන්තාවනා පමණක් බලෙන් විවාහවීම්වලට ලක්වන බව හඳුනාගනු ලබන වහල්භාවය සම්බන්ධ අනුපූරක ප්‍රඥප්තිය බලාත්මක වීමෙන් අනතුරුව, පිරිමි ළමුන් සහ මිනිසුන්ද බලෙන් කරන විවාහවලට ලක්විය හැකි බවට පුළුල් ලෙස පිළිගෙන ඇත. සියළුම ආකාරයේ බලෙන් සිදු කරන විවාහවලට එරෙහිව කටයුතු කිරීම සඳහා, ගොදුරුවන අයගේ ලිංගිකත්වය නොතකා බලෙන් සිදුකරන විවාහ තහනම් කරන නීතීන් සැමදෙනට එකසේ අදාල විය යුතු බවට වගබලා ගැනීම හොඳ පුහුණුවක් වශයෙන් සලකන ලදී.

- **ළමුන්ව සූරාකෑම සඳහා අලෙවි කිරීම,** 1(ඈ)[17] වගන්තිය මගින් දරුවෙකුගේ දෙමාපියන් හෝ භාරකරුවන් මගින් තුන්වන පාර්ශවයකට දරුවාගේ ශ්‍රමය සූරාකෑමට ඉඩලබාදීම ලෙස දක්වයි. මෑතකාලීන ලියවිලි මගින් ඌණපූරණ සැපයීම සඳහාවූ ප්‍රඥප්තියට වඩා පුළුල් අර්ථ නිරූපණයක් ලබාදේ. *වඩාත්ම දරුණු ආකාරයේ ළමා ශ්‍රමය සම්බන්ධ* 1999 *ජාත්‍යන්තර කම්කරු සංවිධාන ප්‍රඥප්තිය* මගින් අවි ආයුධ සහිත ගැටුම්, අශ්ලීල දේ (pornography), මත්ද්‍රව්‍ය නිෂ්පාදනය සහ ජාවාරම් කිරීම වැනි නීති විරෝධී ක්‍රියාවන්, සහ *යම් කාර්යයක්, එහි ස්වරූපය හෝ එය කරන ආකාරය අනුව දරුවන්ගේ සෞඛ්‍යය, ආරක්ෂාව හෝ ගුණධර්ම වලට හානියක් සිදුවන කටයුතු වැනි දේ සම්බන්ධයෙන් බලෙන් දරුවන්ව යොදවා ගැනීම හෝ අනිවාර්යයෙන් සේවයේ යොදවා ගැනීම එකතු කර ඇත.*

*ළමුන් විකිණීම සම්බන්ධයෙන් ළමුන්ගේ අයිතිවාසිකම්, ළමුන් ගණිකා වෘත්තියේ යොදවා ගැනීම සහ ළමුන්ව අශ්ලීල ක්‍රියාවල යොදවා ගැනීම සම්බන්ධ ප්‍රඥප්තියේ* 2002 විකල්ප ප්‍රොටොකෝලයේ 2(අ) වගන්තිය මගින් ළමුන්ව විකිණීම පුළුල් ලෙස අර්ථ නිරූපණය කර ඇත්තේ “දරුවෙකුව යම් පුද්ගලයෙකු හෝ කණ්ඩායමක් විසින් පාරිශ්‍රමිකයකට හෝ වෙන කිසිම වටිනාකමක් සඳහා වෙනත් පුද්ගලයෙකුට හෝ පුද්ගල කණ්ඩායමකට විකිණීම සම්බන්ධ ඕනෑම ක්‍රියාවක් ලෙසටය.”

## හෝඩුවාව: දරුවන්ව සූරාකෑමට ලක්කිරීම සඳහා විකිණීම හඳුනා ගැනීම

ළමුන් හෝ බිළිඳුන් විකිණීමේදී සූරාකෑම සිදුවීම විකිණීමට පසු සිදුවීම අවශ්‍ය නොවන බැවින්, මෙම සංකල්පය දරුකමට හදා ගැනීම සඳහා සහ වාණිජ ලෙස ගැබ් විකිණීම සම්බන්ධ වැඩපිළිවෙලටද අදාල කිරීමට රාජ්‍යයන් මගින් සලකා බැලිය යුතුය.[19]

17 පරවශතා ලෙසද හඳුන්වන මෙම සංකල්ප, ජාත්‍යන්තර නීතියේ අර්ථ නිරූපණය කර ඇති අතර සූරාකෑමේ අවස්ථාවන් හඳුනා ගැනීමට ප්‍රයෝජනවත් විය හැකිය.

18 *Optional Protocol to the Child Convention on the Sale of Children, Child Prostitution and Child Pornography,* 2171 United Nations Treaty Series 227, 25 May 2000, බලාත්මක වූයේ 2002 ජනවාරි 18 වන දිනය, 2(අ) වගන්තිය.

19 තවදුරටත් බලන්න, Anne T. Gallagher, ‘Article 35’, in Phillip Alston and John Tobin, *Commentary to the Convention on the Rights of the Child*, Oxford University Press, forthcoming, 2015. තවද පහත 2.3 හි ඇති බලහත්කාර/නීතිවිරෝධී හදාවඩා ගැනීම් සම්බන්ධ සාකච්ඡා බලන්න.

## ඉන්ද්‍රිය ඉවත් කිරීම

දායකයන් හට ගෙවීම් කරන අයගේ ඉන්ද්‍රිය වාණිජ වශයෙන් විකිණීම සඳහා මෙන්ම ඉන්ද්‍රියන්ට අමතරව ශරීරයේ අංග සංස්කෘතික සහ චාරිත්‍ර පිළිවෙත් වශයෙන් ඉවත් කිරීමේ අරමුණ වෙනුවෙන් මිනිස් ජාවාරම සිදුවිය හැකිය. සමහර රාජ්‍යවල, මිනිස් ජාවාරමට එරෙහි නීති ඉන්ද්‍රිය ඉවත්කිරීමට ඔබ්බෙන් ගොස් ශරීර අංගද (සංස්කෘතික සහ චාරිත්‍ර පිළිවෙත් සම්බන්ධ පුහුණුද ඇතුලත් කිරීම සඳහා) සහ සෛල සහ දියර වර්ගද (වාණිජ වශයෙන් ගැබ් කුලියට දීමද ඇතුලත්වන සේ) ඇතුලත් කරයි. ඉන්ද්‍රිය ඉවත් කිරීම සම්බන්ධව කෙරෙන මිනිස් ජාවාරම අද්විතීය හඳුනාගැනීමේ අභියෝග ඇති කරන්නේ, සූරාකෑමේ ක්‍රියාව එක් වරක් පමණක් සිදුවීම හේතුවෙනි. වෙනත් ආකාරයේ සූරාකෑම්වලදී, දිගින් දිගටම සිදුවන ශ්‍රමය හෝ සේවා සැපයීම මෙයට හාත්පසින් වෙනස්වේ.[20]

## වෙනත් ආකාරයේ සූරාකෑම

මිනිස් ජාවාරම සම්බන්ධ ප්‍රොටොකෝලයේ 3(අ) වගන්තිය මගින් ප්‍රකාශිතව දක්වන සූරාකෑම්වලට රාජ්‍යයන් මගින් අවබෝධ කරගත යුතුය. ප්‍රායෝගික වශයෙන් සිදුවන වෙනත් සූරාකෑම් අතර බලෙන් සිඟාකෑම සහ මත්ද්‍රව්‍ය වගා කිරීම හෝ මත්ද්‍රව්‍ය රැගෙන යන අය වශයෙන් කරන අපරාධ කටයුතු ඇත. මත්ද්‍රව්‍ය හා සම්බන්ධ කරනු ලබන සොයා ගැනීම් සහ නඩුපැවරීමට අමතරව, සිය සිරුරේ මත්ද්‍රව්‍ය රැගෙන යන හෝ මත්ද්‍රව්‍ය වගා කිරීමට මිනිස් ජාවාරමට ලක්කරන අය ඔවුන්ගේ ජීවිතවලට සැලකියයුතු ආකාරයේ හානිවලට නිරාවරණය වීම සිදුවේ.[21]

### හොඳුවාවः විවිධ ආකාරයේ සූරාකෑම් සම්බන්ධයෙන් විශේෂිත දර්ශකයන් ඇතිකල යුතුය

මුලින්ම ප්‍රතිචාර දක්වන අයට විවිධ ආකාරයේ සූරාකෑම් හඳුනා ගත හැකිවන ආකාරයට රාජ්‍යයන් මගින් අධිකාරීන් හට මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධ දර්ශකයන් ප්‍රමාණවත් ආකාරයට විස්තර කර දිය යුතුය. උපකාර සහ ආරක්ෂාව සැපයීමේදී, නිර්වචනයේ වෙනත් අංග සම්බන්ධ වැඩිදුර සාක්ෂි හෙළිදරව් විය හැකිය. 3.3 කොටස මගින් විශේෂිත සහ විස්තරාත්මක දර්ශකයන් වර්ධනය කිරීම සම්බන්ධ පදනම පැහැදිලි කරදේ.

20 ඉන්ද්‍රිය ඉවත් කිරීම සඳහා වන මිනිස් ජාවාරම සම්න්ධ වැඩිදුර විස්තර සඳහා උදාහරණ වශයෙන් බලන්න, *WHO Guiding Principles on Human Cell, Tissue and Organ Transplantation and the Declaration of Istanbul,* මෙම දෙකම http://www.who.int/transplantation/en/ වෙතින් ලබාගත හැකිය.

21 මෙම අමතර ආකාර දෙකම *European Union Trafficking Directive 2011/36/EU* හි හඳුනාගෙන ඇත. බලෙන් සිඟාකෑවීම' ILO *Forced Labour Convention and exploitation of criminal activities* මගින් අර්ථ නිරූපණය කර ඇති ආකාරයට බලෙන් ශ්‍රමය හෝ සේවා ලබා ගැනීම ලෙස අවබෝධ කර ගැනේ. මෙයට දඩුවම්වලට යටත්වන සහ මූල්‍ය ප්‍රතිලාභ ලබාදෙන පික් පොකට් ගැසීම, සාප්පුවලින් භාණ්ඩ ෆ සාරකම් කිරීම, මත්ද්‍රව්‍ය ජාවාරම් කිරීම සහ වෙනත් සමාන ක්‍රියාවලින් ඇතුලත්වේ. බලන්නः Directive 2011/36/EU of the European Parliament and of the Council of the European Union, 5 April 2011, on preventing and combating trafficking in human beings and protecting its victims, and replacing Council Framework Decision 2002/629/JHA, OJ L 101/1, 15 Apr. 2011 (EU Trafficking Directive 2011/36/EU), Article 2(3).

# 2 වන කොටස:

## වගකීම්, උනන්දු සහ අභියෝගයන

### 2.1. හඳුනාගැනීම වැදගත් වන්නේ ඇයි?

මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හඳුනා ගැනීමෙන් තොරව, මිනිස් ජාවාරම සම්බන්ධ ප්‍රොටොකෝලයේ දක්වා ඇති අරමුණු වන වැළැක්වීම, නඩු පැවරීම සහ ආරක්‍ෂාව සැපයීම කාර්‍යක්‍ෂම ලෙස ලබාගත නොහැකිවේ. එමනිසා, සම්පූර්ණ මිනිස් ජාවාරමට එරෙහි ප්‍රතිපත්ති, වැඩසටහන් සහ වෙනත් ක්‍රියාමාර්ග ඇති කිරීමේදී, ප්‍රොටොකෝලයේ දක්වා ඇති වගකීම් ඉටු කිරීමේ අවශ්‍ය අංගයක් ලෙස ගොදුරුවූ අයව හඳුනා ගැනීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කල යුතුය.

හඳුනාගැනීමේ ක්‍රියාවලිය මගින් පුද්ගලයෙකුගේ ගොදුරුවූ තත්වය පිළිගැනීමට තුඩුදෙන අතර එහි ප්‍රතිඵලයක් වශයෙන් වෛද්‍ය සහ වෙනත් සෞඛ්‍යය සේවා, ඉදුම් හිටුම්, ආහාර සහ මූලික අවශ්‍යතාවයන්, උපදේශක සහ මනෝසාමාජික රැකවරණ ආදී උපකාර සහ ආරක්‍ෂණ සේවා හැකි විගස ලබාදීමට හැකිවේ. සමහර රාජ්‍යයන්හි, මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු වශයෙන් හඳුනා ගැනීම මගින් අදාල පුද්ගලයා හට තාවකාලික හෝ ස්ථිර නේවාසිකත්වය වැනි අමතර ප්‍රතිලාභ සහ සේවා සඳහා සුදුසුකම් ලැබේ. හැකි විගස සහ නිසි ආකාරයට මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව හඳුනා ගැනීමට අසමත්වීම මගින් ඔවුන්ව තවදුරටත් අයථා ලෙස භාවිතා කිරීම, සූරාකෑම, සහ ඔවුන්ට උපකාර සහ ආරක්‍ෂාව ලබා ගැනීමට ඇති අයිතිය නැතිකිරීම වැනි ප්‍රතිඵල ගෙනදේමට බොහෝ ඉඩකඩ ඇත. හඳුනා ගැනීම සඳහා ගන්නා කාලය වැඩිවන තරමට, ගොදුරුවූ අයව යථා තත්වයට පත්වීම සහ නැවත සමාජගත කිරීම සංකීර්ණවේ. මෙම හේතුව නිසා, ආරක්‍ෂණ ප්‍රතිපාදන සඳහා ගොදුරුවූවන් හඳුනා ගැනීම පූර්ව අවශ්‍යතාවයකි.[22]

මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හඳුනා ගැනීමට ඔබ්බෙන්, රාජ්‍යයන් සතුව මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව හඳුනා ගැනීමේ වෙනත් වැදගත් හේතු ඇත. අපරාධ සහ අපරාධ පසුපස ඇති අපරාධ ජාල හඳුනාගැනීම සඳහා ගොදුරුවූ අයව හඳුනා ගැනීම ඉතා වැදගත්වේ. ගොදුරුවූ අයව හඳුනාගෙන ඔවුන් හට නිසි ආරක්‍ෂාව සහ උපකාර ලබාදුන් විට, අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට උපකාර කරන වැදගත් සාක්ෂිකරුවන් ඔවුන් විය හැකිය. ගොදුරුවූ අය හඳුනා නොගත්විට, අපරාධ ජාල දුර්විපාක නොලබා දිගටම ක්‍රියාත්මක විය හැකි අතර වටිනා සාක්ෂි නැතිවිය හැකිය. මිනිස් ජාවාරම වැනි රාජ්‍යයන් අතර සිදුවන සංවිධානයවූ අපරාධ මගින් කළු සල්ලි ජාවාරම් කිරීම සහ දූෂණය වැනි වෙනත් අපරාධවලට සාර්ථකව පැවතීමට ඉඩ ලැබෙන අතර ඒ මගින් ආර්ථික සහ සමාජ ප්‍රගතිය වළක්වාලිය හැකිය. බලෙන් ශ්‍රමය ලබා ගැනීම වැළැක්වීම සහ ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීමට රාජ්‍යයන් හට විශේෂ උනන්දුවක් ඇත. මෙයට හේතුව වන්නේ මේ මගින් රැකීරක්‍ෂා අවස්ථා සහ වේතන අඩුවීම සහ රටෙහි සිටින වෙනත් සේවකයන්ගේ තත්වයන් අඩුවිය හැකි වීමයි. මිනිස් ජාවාරමට එරෙහිව කටයුතු කිරීම පුද්ගලයන්ගේ ආරක්‍ෂාව තහවුරු කිරීම පමණක් නොව සමාජවල සෞඛ්‍යය ආරක්‍ෂා කිරීමේ අත්‍යවශ්‍ය අංගයක්වේ.[23]

Table 2: Obligations, interests and tips for victim identification

| වගකීම | උනන්දු | හෝඩුවා |
|---|---|---|
| වැළැක්වීම | මිනිස් ජාවාරම වැළැක්වීම සහ නැවැත්වීම සඳහා මිනිස් ජාවාරමට ගොදුරුවන අයව හඳුනා ගැනීම වැදගත්වේ. | මිනිස් ජාවාරමට එරෙහිව කටයුතු කිරීම සහ සංක්‍රමණිකයන් ජාවාරම් කිරීම සහ ගෘහස්ථ හිංසන වැනි වෙනත් ආකාරයේ අපරාධ සම්බන්ධයෙන් ගොදුරුවූ අය හඳුනාගැනීම ජාතික උපායමාර්ගයන් හා එක් කිරීම. |
| | සාක්ෂි පදනම්වූ වැළැක්වීම සඳහා මිනිස් ජාවාරමට අදාල මුල් හේතුව හඳුනාගැනීම සහ මිනිස් ජාවාරමට ගොදුරුවිය හැකි පුද්ගලයන් සහ කණ්ඩායම් හඳුනා ගැනීම අත්‍යාවශ්‍යවේ. | සූරාකෑමේ අවස්ථාවට පෙර මිනිස් ජාවාරම වැළැක්වීමට උපකාර කිරීම සඳහා මුල් හේතු සහ මිනිස් ජාවාරමට ගොදුරුවිය හැකි පුද්ගලයන්ගේ සහ කණ්ඩායම්වල දුර්වලතාවයන් සම්බන්ධයෙන් දර්ශකයන් වර්ධනය කර ගන්න. |

22 *Policy Guide on Protecting Victims of Trafficking*, Bali Process, 2015 බලන්න.

23 *Policy Guide on Protecting Victims of Trafficking*, section 1.1, Bali Process, 2015 බලන්න.

| | | |
|---|---|---|
| | අදාල අධිකාරීන් මගින් රැස්කරගත මිනිස්ජාවාරම්කරුවන්ගේ පැතිකඩ සහ ගතිලක්‍ෂණ, ජාවාරම් කරන ක්‍රම, තනි පුද්ගලයන් සහ කණ්ඩායම් අතර ඇති සම්බන්ධතා මෙන්ම ඔවුන්වා අල්ලා ගැනීම සඳහා තිබිය හැකි ක්‍රම ඇතුළුව දත්ත සහ තොරතුරු ශක්තිමත් වන්නේ ඒවා මිනිස් ජාවාරමට ගොදුරුවූ අයගෙන් පැමිණෙන විටය. | හදුනාගැනීමේ කාර්‍යාවලියේදී රැස්කරගත් දත්ත සහ තොරතුරු මිනිස් ජාවාරම සම්බන්ධයෙන් රාජ්‍යය ප්‍රතිචාරය සම්බන්ධයෙන් ඇති අඩුපාඩු හදුනා ගැනීමට, අදාල රාජ්‍යවල ක්‍රියාකරන්නන්ගේ හැකියාව වර්ධනය කිරීමට සහ පුහුණු අවශ්‍යතා හදුනා ගැනීමට සහ කම්කරු සහ සංක්‍රමණ ක්ෂේත්‍ර ඇතුළුව වඩා හොඳ ප්‍රතිපත්ති සැකසීමට උපකාර කර ගැනීම. |
| **විමර්ශණය සහ නඩු පැවරීම** | ගොදුරුවූ අයව කාර්‍යක්‍ෂම ලෙස හදුනා ගැනීමට සහ අදාල සාක්‍ෂි රැස්කිරීමට වෘත්තීකයන්ව පුහුණුකල විට මිනිස් ජාවාරම සම්බන්ධ විමර්ශණ කිරීම සහ නඩු පැවරීම ශක්තිමත්වෙ. | අපරාධයේ ගුණාංග සම්බන්ධයෙන් නඩු පවරන අයට පොදු අවබෝධයක් ඇති බවට වග බලා ගැනීම, හදුනාගැනීම සම්බන්ධ රීතීන්, හිංසාවට පත්වූ ගොදුරුවූවන්/සාක්‍ෂිකරුවන්, සංස්කෘතික වශයෙන් සහ භාෂාමය වශයෙන් විවිධවූ ගොදුරුවූවන් මෙන්ම ගොදුරුවූ ළමුන් වැනි අය සමඟ කටයුතු කිරීමේදී විශේෂ සලකා බැලීම් වැනි දේ සම්බන්ධයෙන් මුල්පෙලේ ප්‍රතිචාර දක්වන්නන් හට ගොදුරුවූ අයව හදුනා ගැනීම සම්බන්ධයෙන් පුහුණු වැඩසටහන් වර්ධනය කිරීම. |
| | විමර්ශකයන් සහ නඩුපවරන අය මිනිස් ජාවාරම, මිනිස් ජාවාරම්කරුවන් සහ අදාල අපරාධ සහ අපරාධකරුවන් සම්බන්ධ තොරතුරු සහ සාක්‍ෂි හදුනාගත් මිනිස් ජාවාරමට ලක්වූ අයගෙන් ලබාගනී. | දේශීය සහ අන්තර්ජාතික තත්වයන් සහ සියළුම ආකාරවල සූරාකෑම් වලට ලක්විය හැකි සියළුම ගොදුරුවූවන් (කාන්තාවන්, පිරිමින් සහ දරුවන්) ඇතුලත් කල හැකි බවට වග බලා ගන්නා සක්‍රීය ලෙස ගොදුරුවූ අයව හදුනාගැනීම සඳහා ක්‍රමයක් වර්ධනය කිරීම. |
| **උපකාර සහ ආරක්‍ෂාව** | උපකාර සහ ආරක්‍ෂාව කාර්‍යක්‍ෂම ලෙස ලබාදීම සඳහා මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව හදුනා ගැනීම අත්‍යවශ්‍යවේ. | ගොදුරුවූ අයව විශේෂිතවූ උපකාර සහ ආධාර ලබාදීම සඳහා වගකිවයුතු ආයතන වෙත යොමු කරන්න. මේ මගින් මිනිස් ජාවාරමට ගෙදුරුවූ බවට පූර්වානුමාන කරන අය විසින් උපකාර සහ ආරක්‍ෂාව ලබා ගැනීම සම්බන්ධයෙන් බාධක ඇති නොවන බවට වග බලා ගන්න. මෙයට හදුනාගැනීමේ ක්‍රියාපටිපාටීන් සහ සංක්‍රමණ කළමණාකරණය වෙන්කර තබා ගැනීම ඇතුලත්වේ.<br><br>විධිමත් හදුනාගැනීමේ ක්‍රියාපටිපාටීන් ඔවුන්ගේ වයස, ස්ත්‍රී පුරුෂබව, ලිංගය, ලිංගික සම්භවය, ජාතිකත්වය, හෝ සමාජ සම්බවය හෝ ආබාධිත බව නොතකා ජාත්‍යන්තර නීතියට අනුව සිදුකරන බවට වගබලා ගන්න. |
| | නිසි ආරක්‍ෂාව සහ උපකාර ලැබෙන මිනිස් ජාවාරමට ගොදුරුවූ අය විසින් අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලියට වඩා හොඳින් උපකාර ලබාදිය හැකිය. ඒ මගින් මිනිස් ජාවාරම්කරුවන් හට නඩු පැවරීමත් වැඩිදුර මිනිස් ජාවාරම සිදුවීම වැළැක්වීමටත් හැකිය. | සේවා සපයන්නන් මගින් මුලින්ම හමුවූ අවස්ථාවේ සිට අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය ඔස්සේ, සහ නැවත පිටත්කර යැවීම සහ සමාජගතකරණය යන සෑම අවස්ථාවකම සම්පූර්ණ වශයෙන් උපකාර ලබාදෙන බවට වග බලා ගැනීම.<br><br>ගොදුරුවූ අය හට උපකාර සහ ආරක්‍ෂාව සම්බන්ධයෙන් ඇති අයිතිවාසිකම් සහ අපරාධ යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය පුරා මිනිස් ජාවාරම්කරුවන්ට එරෙහිව ගොදුරුවූවන් හට ඇති විකල්පයන් ගොදුරුවූවන් හට දැනුම් දෙන්න, එසේම ඔවුන් හට දැනුවත් තීරණ ගැනීම සඳහා ඔවුන්ව ශක්තිමත් කරන්න. ගොදුරුවූ අය අධිකාරීන් සමඟ සහයෝගයෙන් කටයුතු කරනවාද යන්න මත හදුනාගැනීම (සහ ඒ මගින් ලැබෙන ආරක්‍ෂාව) තීරණය නොවන බවට තහවුරුවක් ලබා දෙන්න. |
| **සහයෝගීතාවය** | විශේෂඥ රාජ්‍ය නොවන සංවිධානවල සහ වෙනත් අදාල ක්‍රියාකරුවන් මගින් ලබාදෙන විධිමත් දේ ඇතුළුව, බහු ආයතනවල සහභාගිත්වය මගින් හදුනාගැනීමේ යාන්ත්‍රණවල කාර්‍යක්‍ෂමතාවය වැඩිකල හැකි අතර ඒ හේතුවෙන්, වැළැක්වීම, නඩු දැමීම සහ ආරක්‍ෂණ විධිවිධාන තරවීම සිදුවේ. | හදුනාගැනීමේ ක්‍රමය ආයතන සමූහයක් සහ රාජ්‍ය අධිකාරීන් සහ විශේෂඥ රාජ්‍ය නොවන සංවිධාන ඇතුළු රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් එක්ව කරන බහු සහයෝගික ක්‍රියාවලියක් බවට වග බලා ගන්න.<br><br>මිනිස් ජාවාරම සම්බන්ධ ප්‍රවණතාවයන් පිළිබද නිතිපතා තොරතුරු හුවමාරු කර ගැනීම සහ නව තාක්‍ෂණයන් භාවිතා කිරීම ජාවාරමට ලක්වූ අයව හදුනා ගැනීමේදී භාවිතා කරන බවට වග බලා ගන්න. |

## 2.2. මිනිස් ජාවාරමට ගොදුරුවූ අය ඔවුන්ව හඳුනාගැනීමට මැලිවීමට හේතුව අවබෝධකර ගැනීම

මිනිස් ජාවාරමට ගොදුරුවූ අය තමා ගොදුරුවූවන් ලෙස සලකනු ලබන්නේ කලාතුරකිනි. බොහෝ අවස්ථාවල, මිනිස් ජාවාරමට ලක්වුණු අය ඔවුන්ගේ මිනිස් ජාවාරම්කාරයන් මත යැපේ, එමෙන්ම ඔවුන් ගොදුරුවූවන් ලෙස පිළිනොගනී. අනෙක් අය ඔවුන්ගේ ජාවාරම්කරුවන්ව දකින්නේ ඔවුන්ගේ ගැලවුම්කරුවන් වශයෙනි. ගොදුරුවූවන් ඔවුන්ගේ මිනිස් ජාවාරම්කරුවන්ගේ ඥාතීන්වීමටද ඉඩ තිබේ. උදාහරණ වශයෙන්, ළමුන්ව සූරාකෑම සඳහා විකුණන බලෙන් විවාහ සිද්ධකරන තත්වයන් යටතේ, වරදකරුවන් වන්නේ ගොදුරුවූවන්ගේ දෙමාපියන් වන අතර, ඒ හේතුව නිසා ගොදුරුවූවන් අධිකාරීන්ගේ ඉදිරියට එමට මැලිකමක් දක්වයි. ගොදුරුවූ අය සහ මිනිස් ජාවාරම කරන අය අතර පුද්ගලික සම්බන්ධතාවයක් ඇති වෙනත් ආකාරයේ මිනිස් ජාවාරම් සම්බන්ධයෙන්ද මෙය සැබෑවේ. කලින් පැවති සම්බන්ධතාවයක් නොතිබුණද, ගොදුරුවූ අය මිනිස් ජාවාරම්කරුවන් සමඟ පුද්ගලික සම්බන්ධතාවයක් ඇතිකර ගත හැකිය, මෙහිදී මෙම සම්බන්ධතාවය ඔවුන්ව පාලනය කරන සම්බන්ධතාවයක් බව ඔවුන් නොදනී.

හඳුනාගැනීම සම්බන්ධයෙන් තවදුරටත් අභියෝගයන පැනනගින්නේ ගොදුරුවූවන් හට අධිකාරීන් වෙත ගොස් හඳුනා ගැනීම සම්බන්ධයෙන් ඇති දුර්මත සහ/හෝ සත්‍ය වශයෙන්ම පෙළඹවීම සඳහා ඇති අඩුකමයි. මෙය විශේෂයෙන් සිදුවන්නේ මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු අවිධිමත් ආකාරයට රටකට ඇතුළුවූ අවස්ථාවලදීයෑ ඔවුන්ගේ අවිධිමත් තත්වය හේතුවෙන් ඔවුන්ව රටින් පිටත්කර යවනවා යන බියෙන් සිටිය හැකිය. වෙනත් මිනිස් ජාවාරමට ගොදුරුවූ අය, මිනිස් ජාවාරම්කරුවන් අත දරුණු ලෙස පාලනයට යටත් වුවද, හේතු ගණනාවක් මත සූරාකෑමේ සහ අයුතු බලපෑම් කරන සම්බන්ධතාවය තුල සිටීමට මනාපයක් තිබිය හැකිය. උදාහරණ වශයෙන්, ගොදුරුවූ අය සහ ජාවාරම්කරුවන් අතර තද බැඳීම් සහිත සම්බන්ධතා තිබිය හැකි අතර, වෙනත් අය ඔවුන් සිටින තත්වය ඔවුනට ඇති විකල්පවලට වඩා යහපත් බව සිතනවා විය හැකිය. ජාවාරම්කරුවන් සිය ගොදුරුවූ අයව පාලනය කිරීමට බොහෝ අවස්ථාවල මෙම භීෂණයන් සහ කණස්සල්ලන් වාසියට හරවා ගනු ඇත.

හඳුනාගැනීමේ යාන්ත්‍රණයන් සැලසුම්කිරීමේදී සහ ක්‍රියාත්මක කිරීමේදී, හඳුනාගැනීමේදී මතුවන අභියෝගයන් අවබෝධ කරගෙන සැලකිල්ලට ගත යුතුය. මුල් අවස්ථාවලදී යම් අයෙකු මිනිස් ජාවාරමට ලක්වූ බවට පූර්වානුමාන නොකලද, ක්‍රියාවලිය තුල ඕනෑම අවස්ථාවක ඔවුන්ව නිසි ක්‍රියාපටිපාටිය වෙත යොමුකිරීමට ඉඩකඩ සලසන හැකියාවන් ලබාදිය යුතුය.

### රඳවාතැබීම සහ රටින් පිටුවහල් කිරීම සම්බන්ධ තර්ජන

ගොදුරුවූ අය රටෙහි ජාතියට අයත් නොවූ විට, ජාවාරම් කරුවන් විසින් බොහෝවිට ගොදුරුවූ අයව අත්අඩංගුවට ගෙන ඔවුන්ගේ නීතිවිරෝධී තත්වය නිසා හෝ ඔවුන්ව මිනිස් ජාවාරමට ලක්වූ තත්වය හේතුවෙන් සිදුවුණු නීතිවිරෝධී ක්‍රියාකාරකම් හේතුවෙන් ඔවුන්ව රඳවා තබා රටින් පිටුවහල් කරන බවට බොහෝවිට පවසයි. මෙය බොහෝවිට සත්‍ය නොවේ. සත්‍යවන අවස්ථාවල වුවද, සමහර ගොදුරුවූ අය හට රටින් පිටුවහල් කර යැවීම හෝ ප්‍රජාවන් වෙත යැවීම මගින් ඔවුන්ගේ තත්වයේ කිසිදු දියුණුවක් සිදු නොවේ. යම් පුද්ගලයෙකු මිනිස් ජාවාරමට ලක්වීමට හේතුවූ තත්වයන් වෙනස්වී නොමැතිනම්, ඔවුන් ඒ හා සමානම තත්වයකට වැටීමේ අවධානම තව දුරටත් පවතී. ඔවුන්ව මිනිස් ජාවාරමට යොදාගත් අය තවදුරටත් සිටින අතර, ඒ මගින් ඔවුන්ගේ සහ ඔවුන්ගේ පවුලේ අය සම්බන්ධයෙන් ආරක්ෂාව පිළිබඳ ගැටළු මතුවේ.

### හොඳුවාවඃ රඳවා තැබීම සහ රටින් පිටුවහල් කිරීම සම්බන්ධයෙන් ගොදුරුවූවන් හට ඇති ගැටළු ඉදිරිපත් කිරීමට ගොදුරුවූ අයව උනන්දු කිරීම

ගොදුරුවූවන් හට ඇති රඳවා තැබීම සම්බන්ධයෙන් ඇති බිය සම්බන්ධයෙන් සැලකිල්ලට ගැනීම සඳහා, මිනිස් ජාවාරමට ලක්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් විසින් කරන ලද, සංක්‍රමණ වැරදි ඇතුළු, අපරාධ වැරදි සම්බන්ධයෙන් ඔවුන්ව දඬුවමට ලක් නොකිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලසිය යුතුය. ගොදුරුවූ අය තුල ඇති රටින් පිටුවහල් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට, මිනිස් ජාවාරමට ලක්වූ අයහට අවසානයේ සිටින රටෙහි නැවතී සිට අවශ්‍ය උපකාර සහ ආරක්ෂාව ලබාගැනීම සඳහා වීසා මාර්ග ඇතිකල යුතුය.

## මිනිස් ජාවාරම්කරුවන්ගේ බියකිරීම් සම්බන්ධ තර්ජන සහ පළිගැනීම

සමහර මිනිස් ජාවාරමට ගොදුරුවූවන් තමාව හඳුනාගත්විට මිනිස් ජාවාරම්කරුවන්ගෙන් තර්ජන සහ පලිගැනීම්වලට යටත්වන බවට බියක් පවතී. මිනිස් ජාවාරම්කරුවන් බොහෝවිට ගොදුරුවූ අය සහ/හෝ පවුලේ අයට හානි සිදු කරන බවට තර්ජන කරයි. මිනිස් ජාවාරමට ලක්වූ අය සහ ඔවුන්ගේ පවුලේ අයව පලිගැනීමෙන් ආරක්ෂා කිරීමට දේශීය නීති පද්ධතිවල ඇති නොසෑහෙන බව හේතුවෙන් ගොදුරුවූ අය ඉදිරියට ඒම නැවැත්විය හැකිය. ගොදුරුවූ අය වෙනත් අධිකරණ බල සීමා තුල සිටින අවස්ථාවල මෙම බිය වැඩිවිය හැකි අතර විවිධ රටවල සිටින අපරාධ යුක්ති සම්බන්ධ කටයුතු කරන අය විසින් ගොදුරුවූවන්ගේ ආරක්ෂාව තහවුරුකල යුතුය.

### හොඳුවාවः මිනිස් ජාවාරමට ලක්වූ අය සහ ඔවුන්ගේ පවුලේ අයව ආරක්ෂා කිරීම මගින් ඔවුන් හට ඉදිරියට ඒමට උනන්දු කිරීම

ගොදුරුවූවන්, සාක්ෂිකරුවන් සහ ඔවුන්ගේ පවුල්වල අයට කාර්යක්ෂම ආරක්ෂාව ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට රාජ්‍යයන් මගින් සලකා බැලිය යුතුය. ආරක්ෂාව අවශ්‍ය අය වෙනත් රාජ්‍යයන්හි සිටින අවස්ථාවල, එම රාජ්‍යයන්හි සිටින අපරාධ යුක්තිය පසිඳලින අය සමඟ සහයෝගයෙන් කටයුතු කිරීමට උත්සාහ කල යුතු අතර නිසි අවස්ථාවල, හානිවීමේ අවධානම ඇති අය හට ආරක්ෂාව සැපයීමට වීසා බලපත්‍ර සහ සංක්‍රමණ මාර්ග ලබාදිය යුතුය.

## කැළැල් ඇතිවීම සම්බන්ධ ලැජ්ජාව සහ බිය

ගොදුරුවූ අය සහ ඔවුන්ගේ පවුල්වල අනන්‍යතාවය, රහස්‍යභාවය සහ පුද්ගලිකභාවය ගොදුරුවූවන් හට උපකර සහ ආරක්ෂාව ලබාදෙන වැඩසටහන් මගින් ආරක්ෂා කර නැති අවස්ථාවල, ගොදුරුවූවන් විසින් හඳුනාගැනීම හේතුවෙන් තමාව ලැජ්ජාවට පත්වීම, අපකීර්තියට පත්වීම සහ සමාජයෙන් නෙරපා දැමීමට තුඩුදිය හැකි බවට බියක් ඇතිවිය හැකිය. ඔවුන් ගොදුරුවූ බවට පිළිගනු ලැබුවහොත්, ගොදුරුවූවන්ගේ පවුල්වල අය සහ ප්‍රජාවන් ඔවුන් අසාර්ථකවූ බව සිතිය හැකි අතර (විශේෂයෙන් සංක්‍රමණය කරන අතරතුර ගොදුරුවූ අයව සූරාකෑමට ලක්කලේ නම්) එහි ප්‍රතිඵලයක් වශයෙන් සිය පවුලේ අයගේ අවශ්‍යතාවයන් ඔවුනට සපුරාලිය නොහැකි බවට බියක් තිබිය හැකිය. විශේෂයෙන් ගොදුරුවූ පිරිමින් තමා ගොදුරුවූ බව හෝ තමාව රැවටූ බවට පිලිගැනීමට මැළිකමක් දක්වයි.

### හොඳුවාවः මිනිස් ජාවාරමට ලක්වූ අවය කැලැල්වීමෙන් ආරක්ෂා කිරීම මගින් ඔවුන් හට ඉදිරියට ඒමට උපකාර කිරීම

ගොදුරුවූ අයගේ තොරතුරු සම්බන්ධ රහස්‍යභාවය නගාසිටුවීම මගින් සහ රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජාවන් සහ ගොදුරුවූවන් අය සමඟ කටයුතු කිරීම මගින් ඔවුන්ගේ ගැටළු සැලකිල්ලට ගනු ලබන ආරක්ෂණ ප්‍රතිපත්ති වර්ධනය කිරීම මගින්, ගොදුරුවූවන් තුල ඇති ලැජ්ජාව සහ කැලැල් සම්බන්ධයෙන් ඇති බිය සැලකිල්ලට ගනු ලබන උපකාර සහ ආරක්ෂණ වැඩසටහන් ඇතිබවට වගබලා ගත යුතුය.

# 3 වන කොටස:

## මිනිස් ජාවාරමට ගොදුරුවූ අය හඳුනාගැනීම සම්බන්ධ ක්‍රියාවලිය

### 3.1. මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව හඳුනා ගත හැක්කේ කා විසින්ද?

මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව හඳුනාගැනීම කිසිසේත් අවසානාත්මක, එක් අවස්ථාවක පමණක් සිදුවන දෙයක් නොවන අතර, පහත සඳහන් පියවර ඇතුලත් ක්‍රියාවලියක්වේ:

1. යම් පුද්ගලයෙකු මිනිස් ජාවාරමට ලක්වුණු අයෙකු බව යෝජනා කරන, ආරම්භක පරීක්ෂාවක්. මෙය පූර්වානුමාන කල ගොදුරුවූ අය හා සම්බන්ධවන ඕනෑම අයෙකු විසින් කල හැකි අතර, ප්‍රතිඵලය වනනේ අදාල අධිකාරීන් වෙත යොමු කිරීමවේ.
2. අදාල පුද්ගලයා මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු බව යෝජනා කරන ප්‍රමාණවත් දර්ශකයන් මගින් අදාල අධිකාරීන් මගින් පූර්වානුමානය ඇතිකරන අතර ඒ හේතුව නිසා ආරම්භක උපකාර සහ ආරක්ෂණ සඳහා ප්‍රවේශය ලබාදිය යුතුය.
3. අදාල පුද්ගලයා මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු බව අදාල අධිකාරීන් විසින් තහවුරු කිරීම. මෙය මගින් ඇතිවන ප්‍රතිඵලය වන්නේ අදාල පුද්ගලයා හට වඩා සම්පූර්ණ උපකාර සහ ආරක්ෂණ සේවා සඳහා සුදුසුකම් ලැබීමවේ. මේ අතරම නීතිවිරෝධී ජාවාරම්කරුවන් සම්බන්ධ විමර්ශණ සහ නඩු පැවරීම් සිදුවිය හැකිය.
4. මිනිස් ජාවාරම්කරුවකුව වැරදිකරු කිරීමේ ප්‍රතිඵලයක් වශයෙන් යම් පුද්ගලකෙු මිනිස් ජාවාරමට ගොදුරුවූ අයකු වශයෙන් තහවුරු කර ගැනීම. මෙම පියවර සමහර අධිකරණ බල ප්‍රදේශවල පමණක් අදාල විය හැකිය. කෙසේවුවද, මිනිස් ජාවාරම යන අපරාධය සම්බන්ධයෙන් සාර්ථක ලෙස නඩු පවරා වැරදිකරු කල නොහැකිවීම මගින් යම් පුද්ගලයෙකු මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු නොවන බව අදහස් නොවේ.

ගොදුරුවූ අයෙකු, ඔහු හෝ ඇයගේ පවුලේ අයෙකු හෝ වෙන අයෙකු විසින් කෙළින්ම වාර්තා කිරීම හේතුවෙන් ඇතිවන ප්‍රතික්‍රියාකාරී විමර්ශනවල ප්‍රතිඵලයක් වශයෙන් මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව හඳුනාගත හැකිය. පොලීසිය හෝ වෙනත් ක්‍රියාකරුවන් - දේශසීමා සහ කම්කරු නිලධාරීන් ආදී සිය රාජකාරි කටයුතු කරන අතරතුරදී කරන විමර්ශණ සහ මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව හඳුනාගැනීමට ඇති හැකියාව නිසා සක්‍රිය ලෙස සිදුකරන කටයුතුවලදීද හඳුනාගැනීම සිදුවිය හැකිය. ප්‍රතික්‍රියාකාරී ලෙස හඳුනාගැනීම සම්බන්ධයෙන් විශ්වාසය තබනවාට වඩා සක්‍රිය ලෙස කටයුතු කර ගොදුරුවූ අයව හඳුනාගැනීම සඳහා වැඩිපුර උත්සාහ ගත යුතුය.

විශේෂයෙන් මුල් පරීක්ෂණ අවස්ථාවේදී, ඥාතීන්, මිතුරන් සහ සම තත්වයේ සිටින ප්‍රජාව තුල සිටින ඕනෑම අයෙකු විසින් ගොදුරුවූවන් හඳුනා ගැනීම සම්බන්ධයෙන් කාර්යභාරයක් ඉටුකල හැකිය. සිවිල් සමාජ ක්‍රියාකරුවන්, වෛද්‍ය වෘත්තීකයන්, සේවක සමිති සහ රැකීරක්ෂා නියෝජිත ආයතන වැනි රාජ්‍ය නොවන ක්‍රියාකාරීන් තොරතුරු සම්බන්ධ වටිනා සම්පතක් වන අතර පූර්වානුමාන කල ගොදුරුවූවන් හඳුනාගැනීම සහ නිසි අධිකාරීන් වෙත යොමු කිරීම සම්බන්ධයෙන් වැදගත් කාර්යයක් ඉටුකල හැකිය.

කෙසේවුවද, හඳුනාගැනීම සම්බන්ධ ප්‍රාථමික වගකීම ඇත්තේ රාජ්‍යයන් හටය. නීතිය බලාත්මක කරන අධිකාරීන් (පොලීසිය, නඩු පවරන අය, අධිකරණ නිලධාරීන්, සංක්‍රමණ සහ රේගු නිලධාරීන්, සහ කම්කරු පරීක්ෂකයන්), සමාජ සේවා සේවකයන්, පළාත් පාලන පරිපාලකයන්, සහ තානාපති සහ කොන්සියුලර් නිලධාරීන් විසින්ද ගොදුරුවූ අයව හඳුනාගැනීම සම්බන්ධයෙන් කාර්යභාරයක් ඉටුකල හැකිය.[24]

**හෝඩුවාව: මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගැනීම වැඩිදියුණු කිරීම සඳහා මිනිස් ජාවාරම සම්බන්ධ මහජන අවබෝධය වැඩි කරන්න**

මිනිස් ජාවාරම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර සඳහා රාජ්‍යයන් මගින් නව උපායන් දියත්කල යුතු අතර ඒ සඳහා උපකාර ලබාදිය යුතුය. එම ව්‍යාපාර මගින් අරමුණු කරන ප්‍රේක්ෂක පිරිස හට පහත දේ පැහැදිලි කරන්නේ නම් ඉතා යෝග්‍යවේ අ) මිනිස් ජාවාරම යනු කුමක්ද සහ එය කුමන ආකාරයක් ගනීද යන්න, සහ ආ) පුද්ගලයන් විසින් ගත හැකි ක්‍රියා මාර්ග, හොට්ලයින් දුරකථන මාර්ග ඔස්සේ ලබාදෙන තොරතුරු ඇතුළු, විශේෂයෙන් නිසි අධිකාරීන් වෙත යොමු කිරීම් සඳහා අදාල විස්තර සැපයීම.

24 The 1967 *Vienna Convention on Consular Relations* මගින් යවනු සහ ලබන රාජ්‍යයේ කටයුතු ඉටුකිරීමේදී කොන්සියුලර් නිලධාරීන්ගේ කාර්යභාරය, අයිතිවාසිකම්වී සහ වගකීම් දක්වයි. මේවායින් බොහෝමයක් මිනිස් ජාවාරමට ගොදුරුවූ අයට උපකාර කිරීම සම්බන්ධයෙනි. The Handbook for Diplomatic and Consular Personnel on How to Assist and Protect Victims of Human Trafficking යනු කොන්සියුලර් කාර්ය මණ්ඩලය වෙත ප්‍රයෝජනවත් මෙවලමක් වන අතරඑ මගින් වීසා අයදුම්පත්‍ර සලකා බැලීමේදී සැලකිල්ලට ගතයුතු විශේෂිත දර්ශකයන් දක්වා ඇත. බලන්න: *The Handbook for Diplomatic and Consular Personnel on how to Assist and Protect Victims of Human Trafficking,* Council of Baltic Sea States Secretariat, 2011.

බොහෝ රාජ්‍යයන්හි, නිල වශයෙන් පූර්වානුමාන කරන ක්‍රියාවලිය, තහවුරුකිරීම, සහ සනාථ කිරීම කරන අදල අධිකාරීන් මගින් අදාල පුද්ගලයා මිනිස් ජාවාරමට ලක්වූ අයෙකුගේ තත්වය නිර්ණය කරන අතර ඔවුන් හට අදාල අකාරයට අවශ්‍ය මට්ටමේ උපකාර සහ ආරක්ෂාව ලබාදේ.

සමහර රාජ්‍යයන්හි, මෙම ක්‍රියාවලි සම්බන්ධ වගකීම නීතිය බලාත්මක කරන නිලධාරීන් හට ලබාදෙන අතර, වෙනත් අවස්ථාවල, සමාජ සුබසාධනය සම්බන්ධයෙන් වගකීම ඇති රාජ්‍ය ආයතන හට ලබාදේ. වෙනත් රාජ්‍යයන් තුල, ගොදුරුවූ අය හදුනා ගනු ලබන නිල ක්‍රියාවලිය විශේෂඥවූ රාජ්‍ය නොවන ක්‍රියාකරුවන් හට භාරදී ඇත. මිනිස් ජාවාරමට ලක්වූ අය හදුනාගැනීම සම්බන්ධයෙන් කොන්සියුලර් නිලධාරීන් විසින්ද කාර්යභාරයක් ඉටුකල හැක.

## හොඳුවාව: හදුනාගැනීම හා සම්බන්ධවන විවිධ පාර්ශවකරුවන්ගේ හැකියාව ශක්තිමත් කිරීම

කාර්යක්ෂම ලෙස ගොදුරුවූ අයව හදුනා ගැනීමේ ක්‍රියාවලියේදී පුළුල් පරාසයක රාජ්‍ය අධිකාරීන් සහ වෙනත් අදාල ක්‍රියාකරුවන්ගේ කාර්යභාර සහ වගකීම් සම්බන්ධ පැහැදිලි මාර්ගෝපදේශ සහ මෙහෙයුම් ක්‍රියාපටිපාටීන් හඳුන්වාදීම.

හදුනාගැනීම සම්බන්ධයෙන් රාජ්‍යයක ඇති ප්‍රවේශය නොතකා, කඩිනමින් සහ කාර්යක්ෂමව මිනිස් ජාවාරමට ලක්වූ අයව හදුනා ගැනීම සඳහා අදාල පාර්ශවකරුවන් හට නිසි පුහුණුව ලබාදීම අත්‍යාවශ්‍යවේ.[25] හදුනාගැනීම සඳහාවූ සම්මත මාර්ගෝපදේශ සහ ක්‍රියාපටිපාටීන් මගින් මිනිස් ජාවාරමට ලක්වූ බවට පූර්වානුමාන කරන අයගේ අභිමානය සහ මිනිස් අයිතිවාසිකම්වලට ගරුකර ආරක්ෂා කල යුතුය. [26]

## හොඳුවාව: මිනිස් ජාවාරම්කරුවන් සමඟ සම්බන්ධවන පුද්ගලයන් හට හදුනාගැනීම සම්බන්ධ පුහුණුව ලබාදීම

මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව හදුනාගැනීමේදී මුල් පෙළේ නිලධාරීන්ව පුහුණු කිරීමට ප්‍රමුඛත්වය දීම වැදගත්වේ. යම් අයෙකු මිනිස් ජාවාරමට ලක්වූ අයෙකුද යන්න යෝජනා කරන දර්ශක සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා මිනිස් ජාවාරමට ලක්වූ අය සමඟ සම්බන්ධවන ගුරුවරු, පුවත්පත් කලාවේදීන්, වෛද්‍ය වෘත්තිකයන්, පුද්ගලික අංශයේ ක්‍රියාකරුවන් සහ ප්‍රජාව තුල සිටින වෙනත් අය හට පුහුණුව ලබාදීම සලකා බැලිය යුතුය.

25 (E/2002/68/Add.1), United Nations High Commissioner for Human Rights, Guideline 2: Identification of trafficked persons and traffickers, Guideline 2(3).

26 *Policy Guide on Protecting Victims of Trafficking*, Bali Process, 2015, section 3 on “Coordination and the multi-stakeholder approach” ද බලන්න.

## 3.2. මූලික ක්‍රියාවලි

හඳුනාගැනීමේ ක්‍රියාවලියේ සෑම අදියරකදීම, මුලින්ම සම්බන්ධවූ අවස්ථාවේ සිට සම්මුඛ පරීක්ෂණ පවත්වන අවස්ථාව තෙක්, නිරීක්ෂණ සහ අන්තර්ක්‍රියා ඔස්සේ මිනිසුන්ව පරීක්ෂාවට ලක්කිරීමට අවස්ථා ලබාදේ. මූලික හඳුනාගැනීමේ ක්‍රියාවලියේ එක් එක් අදියරේදී, ගොදුරුවූ අයගේ උපකාර සහ ආරක්ෂණ අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් වෘත්තීකයන් සැලකිල්ලට ගත යුතුය.[27] විශේෂිත ආරක්ෂණ අවශ්‍යතාවයන් හඳුනාගත් අවස්ථාවලදී (උදාහරණ වශයෙන්, මිනිස් ජාවාරමට ලක්වූ අය දරුවන් හෝ සරණාගත පතන්නන්වන අවස්ථාවල) අවශ්‍ය අවස්ථාවල නිසි යොමුකිරීම් කල හැකිවනසේ රාජ්‍යයන් මගින් පුළුල් ආරක්ෂණ ක්‍රියාවලි තුලට හඳුනාගැනීමේ ක්‍රියාවලි ඇතුලත් කිරීමට සලකා බැලිය යුතුය.

ආරම්භක සම්බන්ධවීම → ආරම්භක සම්මුඛ පරීක්ෂණය → විධිමත් සම්මුඛ පරීක්ෂණ

### A. ආරම්භක සම්බන්ධවීම

මුලින්ම සම්බන්ධවූ අවස්ථාවේ, සලකා බැලිය යුතු වැදගත් දෙයක් වන්නේ එම පුද්ගලයා මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු විය හැකිද යන්න සහ ආරම්භක උපකාර සහ ආරක්ෂාව අවශ්‍යද යන්නයි.

මූලික පරීක්ෂාව සිදුවන්නේ මිනිස් ජාවාරමට ලක්වූ බවට පූර්වානුමාන කරන අයෙකු නිරීක්ෂණ (අදාල පුද්ගලයා සමග ඇතිවන කථාබහ, ඔහුගේ හෝ ඇයගේ හැසිරීම, පෙනෙන ආකාරය සහ අවස්ථානුගත කරුණු), තුන්වන පාර්ශවයන් මගින් කරන යොමුකිරීම් මගින් ලැබුණු තොරතුරු සහ තමා විසින්ම හඳුනා ගැනීම මගින් ඇතිවූ ප්‍රතිඵල මගිනි. කෙසේවුවද, ඉහත 2.2 කොටසේ සාකච්ඡා කල කරුණු හේතුවෙන් මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු තමාව හඳුනා ගැනීම සිදු නොකර සිටිය හැකිය.

භාෂාව සහ සංස්කෘතික බාධක මෙන්ම ලිංගිකත්වය සම්බන්ධ හේතු නිසා මුලින්ම සම්බන්ධවූ අවස්ථාවේ සිදුකරන ආරම්භක පරීක්ෂාවට බාධා ඇතිවිය හැකිය. එවැනි බාධකවලට අර්ධ වශයෙන් මුහුණ දිය හැක්කේ පූර්වානුමාන කල ගොදුරුවූ අය සමග මුලින්ම සම්බන්ධ වන අය හට භාෂා හෝ සංස්කෘතික නිපුණතා තිබීම (නැතිනම් එවැනි නිපුණතා ඇති අය සඳහා ක්ෂණික ප්‍රවේශය) මගින් මුලින්ම සම්බන්ධවූ අවස්ථාවේ ඔවුන්ව පරීක්ෂාවට ලක්කිරීමට අවශ්‍ය දේ ලබාදීම මගිනි.

තහවුරු කිරීම අවසානාත්මක ලෙස සිදුකල නොහැකි අවස්ථාවල, උපකාර සහ ආරක්ෂණ සේවා සඳහා ප්‍රවේශය ලබාදීම සඳහා මිනිස් ජාවාරමට ලක්වූ අයෙකු බවට වන පූර්වානුමානය අදාල විය යුතුය. මිනිස් ජාවාරමට ලක්වූ බවට පූර්වානුමාන කරන අයව හමුවුණු විට, ඔවුන් ක්ෂණික අන්තරායක හෝ හදිසි වෛද්‍ය අවධානය හෝ වෙනත් උපකාර අවශ්‍යව සිටිය හැකිය. මුලින්ම සම්බන්ධවූ අවස්ථාවේදී වැදගත්ම ප්‍රමුඛතාවය වන්නේ ඔවුන්ගේ ක්ෂණික ආරක්ෂාව සහතික කිරීමයි.[28] මිනිස් ජාවාරමට ගොදුරුවූ බවට පූර්වානුමාන කරන අයව ඔවුන්ගේ සමාජ, වෛද්‍ය සහ මානසික රැකවරණය සහ ඔවුන් තවදුරටත් හානියට පත්වීමෙන් ආරක්ෂා කිරීම සඳහා ආරක්ෂාකාරී වාසස්ථාන ලබාදෙන බවට බවගබලා ගැනීම සඳහා විශේෂඥ සේවා සපයන්නන් වෙත යොමුකල යුතුය. ඔවුන්ගේ පුද්ගලිකත්වය ආරක්ෂා කිරීමත්, උපකාර සහ ආරක්ෂාව ලබා ගැනීම සඳහා ඔවුන්ගේ දැනුවත් කැමැත්ත ලබා ගැනීමත් ඉතා වැදගත්වේ.[29]

27 පහත දක්වා ඇති තොරතුරුවලට අමතරව, ගොදුරුවූවන් ආරක්ෂා කිරීම සම්බන්ධ වැඩිදුර විස්තර *Policy Guide on Protecting Victims of Trafficking* හි ලබාදේ.

28 බලන්න *The IOM Handbook on Direct Assistance for Victims of Trafficking*, IOM, 2005.

29 බලන්න *Policy Guide on Protecting Victims of Trafficking*, Bali Process, 2015.

මිනිස් ජාවාරමට ලක්වුණු ළමුන්ව හඳුනාගැනීම සම්බන්ධයෙන්, කඩිනම් හඳුනාගැනීම සහ විශේෂඥ ළමා සේවා සපයන්නන් හට හැකි විගස දැනුම් දීමේ ක්‍රියාමාර්ගයන් ක්‍රියාත්මක කිරීම වැදගත්වේ. ළමුන්, ළමුන් ලෙස නොපෙනිය හැකි අතර සහ/හෝ ඔවුන් ඔවුන්ගේ වයස සම්බන්ධයෙන් බොරු කියනවා විය හැකි බැවින්, ළමුන්ගේ අයිතිවාසිකම් සම්බන්ධ ප්‍රඥප්තිය අනුව ළමයෙකු වියහැකි පුද්ගලයෙකු ළමයෙකු වශයෙන් සැලකීම හොඳම පුරුද්දවේ. එසේම, ළමයෙකු මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකුවූ අවස්ථාවක, වෙනත් තීරණයකට එළඹෙන තෙක් ඔහු හෝ ඇය ගොදුරුවූ අයෙකු වශයෙන් පූර්වානුමාන කල යුතුය.[30]

## හෝඩුවාව: මිනිස් ජාවාරමට ලක්වන දරුවන් හඳුනා ගැනීම ශක්තිමත් කිරීම

මිනිස් ජාවාරමට ලක්විය හැකි දරුවන්ව හැකි විගස හඳුනා ගැනීමට ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කිරීම සහ පහත කරුණු දෙකම ඉටුකරන හඳුනාගැනීමේ කාර්‍යාවලි ඔස්සේ විශේෂඥ ළමා සේවා සපයන්නන් හට ක්‍ෂණිකව දැනුම්දීම:

- බාලවයස්කාරත්වය පූර්වානුමාන කිරීම, සහ
- ගොදුරුවූ තත්වය පූර්වානුමාන කිරීම.

### B. ආරම්භක සම්මුඛ පරීක්‍ෂණය

ආරම්භක සම්මුඛ පරීක්‍ෂණයේදී යම් පුද්ගලයෙකු පූර්වානුමාන කල හැකි ආකාරයට මිනිස් ජාවාරමට ලක්වූ අයෙකුද යන්න තහවුරු කරගත හැකිවේ. මූලික සම්මුඛ පරීක්‍ෂණයේ වැදගත් අරමුණක් වන්නේ අවධානම් ඇගයීමට ලක්කර අවශ්‍ය විශේෂිත උපකාර සහ ආරක්‍ෂාව සම්බන්ධ නිර්ණය කිරීමවේ. ආරම්භක සම්මුඛ පරීක්‍ෂණය අවස්ථාවේදී, සම්මුඛ පරීක්‍ෂණයේ අරමුණ, ක්‍රියාපටිපාටිය, සහ ප්‍රතිඵල අදාල පුද්ගලයා හට දැනුම් දිය යුතුය. අදාල පුද්ගලයා හට, අවශ්‍ය නම්. පළපුරුද්ද ඇති භාෂණ පරිවර්තකයෙකුගේ උපකාරය ඇතිව, ඔහුට හෝ ඇයට තේරෙන භාෂාවකින් පැහැදිලි තොරතුරු ලබාදිය යුතුය.

සම්මුඛ පරීක්‍ෂණය පවත්වන අය ගොදුරුවූ බවට පූර්වානුමාන කරන මිනිස් ජාවාරමට ලක්වූ අය සමඟ විශ්වාසය ගොඩනැගෙන ආකාරයට සහ ඔහු හෝ ඇයට පහසුවෙන් කථාකල හැකි පරිසරයක් ඇතිකර කථාබහ පහසුවන ආකාරයට කිරීමට අවශ්‍ය පුහුණුව ලබාදිය යුතුය. සම්මුඛ පරීක්‍ෂණ පවත්වන අය හට චිත්ත කම්පනය කුමක්ද යන්න අවබෝධ කර ගැනීම සම්බන්ධයෙන් සහ සම්මුඛ පරීක්‍ෂණය කරන අවස්ථාවේ නැවත එම චිත්ත පීඩනය ඇතිවීම වැළැක්විය හැකි ආකාරය සම්බන්ධයෙන් පුහුණුවක් ලබාදිය යුතුය. මිනිස් ජාවාරමට ගොදුරුවූ අය සමඟ කටයුතු කිරීමට සහ ඔවුන් සහ අධිකාරීන් අතර විශ්වාසය ගොඩනැගීමට සිවිල් සමාජ ක්‍රියාකරුවන් ඉතා වටිනා සේවයක් ඉටුකල හැකිය. සමහර රාජ්‍යයන් මගින් ආරම්භක සම්මුඛ පරීක්‍ෂණය මෙහෙයවීම සඳහා ප්‍රශ්නාවලියක් භාවිතා කෙරේ.[31]

විවිධ භාෂා සහ සංස්කෘතීන් මගින් ඇතිකරන අභියෝගයන්ට මුහුණ දීමට සහ සම්මුඛ පරීක්‍ෂණයට භාජනය කරන අයගේ පුද්ගලික ගතිලක්‍ෂණවලට අනුකූල වන ආකාරයට සම්මුඛ පරීක්‍ෂණ ශිල්පක්‍රම භාවිතා කිරීම සඳහා සම්මුඛ පරීක්‍ෂණ පවත්වන අය හට නිසි කුසලතා අවශ්‍යවේ.

- **භාෂාව සම්බන්ධ සලකා බැලීම්:** සම්මුඛ පරීක්‍ෂණ පවත්වන අය හට ලැයිස්තුවක සිටින කෙටි දැන්වීමකින් ලබාගත හැකි භාෂාණ පරිවර්තකයන් මගින් උපකාර ලබාදේ. මෙහිදී, භාෂාණ පරිවර්තක මගින් කරන බලපෑම, විශ්වාසය ගොඩනැගීමට වාර්ගික හෝ සංස්කෘතික වෙනස්කම් සැලකිල්ලට ගැනීම සිද්ධ කෙරේ. භාෂණ පරිවර්තකයන් අපක්‍ෂපාතී විය යුතු අතර, ඔවුන්ගේ කාර්‍යභාරය සහ රහස්‍යභාවය සම්බන්ධයෙන් හොඳින් දැනුවත් කර තිබිය යුතු මෙන්ම ඒ සම්බන්ධයෙන් හොඳින් පුහුණුකර තිබිය යුතුය. සම්මුඛ පරීක්‍ෂණ කාර්‍යාවලියේදී භාෂණ පරිවර්තකගේ කාර්‍යභාරය සම්බන්ධයෙන් පූර්වානුමාන කල ගොදුරුවූ අය හට පැහැදිලි කර දිය යුතුය.
- **ලිංග සහ වයස සම්බන්ධ සලකා බැලීම්:** මිනිසුන්ව සැමවිටම සමාන ලිංගය ඇති අයෙකු හෝ එවැනි අයෙකු සිටින විට සම්මුඛ පරීක්‍ෂණයට භාජනය කිරීම සැමවිටම වැදගත්වේ. ළමුන් හට (නැතිනම් ළමුන් වියහැකි අය හට) අදාල ආකාරයට භාරකාරයෙකු පත්කල යුතු අතර (උදාහරණ වශයෙන්, ඔවුන් දෙමාපියන් සමඟ නොසිටින විට) සම්මුඛ පරීක්‍ෂණයට භාජනය කල යුත්තේ ළමුන් සමඟ කටයුතු කිරීම සඳහා පුහුණුව ලත් අය විසින් පමණි.

30 Legislative Guide, Trafficking, paragraph 65; *UNICEF Guidelines on the Protection of Child Victims of Trafficking, and Commentary to the OHCHR Principles and Guidelines on Human Rights and Human Trafficking,* OHCHR, 2010, පිටු 162-164.

31 උදාහරණ වශයෙන්, *Regional Guidelines for the Preliminary Identification and Referral Mechanisms for Migrant Populations in Vulnerable Situations* (presented by Costa Rica prepared jointly with El Salvador, Guatemala, Honduras and Nicaragua, with IOM and UNHCR support, presented to the Regional Consultation Group on Migration (RCGM) of the Regional Conference on Migration (RCM) in June 2012), 11 වන පිටුවේ.

- **සංස්කෘතික සලකා බැලීම් සම්බන්ධයෙන්:** සම්මුඛ පරීක්ෂණය කරන අය සම්මුඛ පරීක්ෂණයට ලක්වන අයගේම ප්‍රජාවගෙන් හෝ සංස්කෘතික පසුබිමකින් වීම සුදුසු නොවේ. ඇය හෝ ඔහු එම සංස්කෘතික පසුබිමකින්ම පැමිණෙන කෙනෙකු වීම සම්බන්ධයෙන් වැඩි මනාපයක් තිබිය හැකි අතර, සුරාකෑම සම්බන්ධයෙන් අදාල ප්‍රජාව සම්බන්ධවන හෝ නිහඬව සිටින අවස්ථාවල, සිය ප්‍රජාවගේම කෙනෙකු විසින් සම්මුඛ පරීක්ෂණය කිරීම මගින් ගොදුරුවූ අයව අවධානමට ලක්විය හැකිය.

නිශ්චිත සම්මුඛ පරීක්ෂණයක් සඳහා කුමක් යෝග්‍යද යන්න නිර්ණය කිරීම සඳහා ඔහුගේ හෝ ඇයගේ මනාපයන් සහ එම මනාපයන් හට හැකිතාක දුරට ඉඩකඩ ලබා දීම සඳහා සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන අය සමඟ සාකච්ඡා කිරීම අවශ්‍යවේ.

### හොඳුවාවඃ ගොදුරුවූ අය සම්බන්ධයෙන් සංවේදී සම්මුඛ පරීක්ෂණ උපක්‍රම භාවිතයට උපකාර කිරීම

භාෂාව, ස්ත්‍රී පුරුෂ බව, වයස සහ සංස්කෘතික සම්බන්ධ කරුණු සලකා බලන නිපුණතාවයන් සම්මුඛ පරීක්ෂණ කරන අය හට ඇති බවට වග බලා ගැනීම. හැකි සෑම අවස්ථාවකම, සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන අය සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ මනාපයන් සොයා බලා හැකිතාක් දුරට එම මනාපයන් හට ඉඩකඩ ලබාදීම.

ආරම්භක සම්මුඛ පරීක්ෂණයක් සිදු කිරීමේදී, අදාල පුද්ගලයාගේ තත්වය සහ ගතිලක්ෂණ කුමක් වුවද, සැලකිල්ලට ගතයුතු වැදගත් දේ ඇත. උදාහරණ වශයෙන්, සරණාගතබව ඉල්ලා සිටින මිනිස් ජාවාරමට ලක්වූ අයගෙන් සරණාගත සම්බන්ධ ඉල්ලීම් ලබාගැනීමට සහ එවා සැලකිල්ලට ගැනීමට විශේෂ ක්‍රියාපටිපාටි හඳුනාගැනීමේ ක්‍රියාවලියට ඇතුලත් කිරීම ප්‍රයෝජනවත්වේ.[32] සිය මව්බිම තුලදී වධහිංසාවලට ලක්වීමේ හෝ දරුණු හානියකට ලක්වීමේ අවධානම ඇතිබවට හැඟවීමක් කර ඇති අය සම්බන්ධයෙන් සරණාගත තත්වය තීරණය කිරීම සරණාගත අධිකාරීන් (හෝ ජාතික සරණාගත ක්‍රමයක් නැති සමහර රටවල UNHCR) විසින් ගොදුරුවූ අයව හඳුනාගැනීමේ ක්‍රියාවලියේදී කල යුතුය. එසේම, මිනිස් ජාවාරමට එරෙහිව කටයුතු කරන අධිකාරීන් විසින් මිනිස් ජාවාරමට ලක්වූ අයගේ ලක්ෂණ පෙන්වන අයව සරණාගත ඉල්ලීම් සම්බන්ධයෙන් පරීක්ෂාකර බැලිය යුතුය. සරණාගතයන් වශයෙන් ජාත්‍යන්තර ආරක්ෂාව ඉල්ලා සිටීමට බලාපොරොත්තුවන සරණාගත පතන්නන් හට එම යොමුකිරීම් සඳහා සහ, මිනිස් ජාවාරමට ගොදුරුවූ සරණාගතයන්ව මිනිස් ජාවාරමට එරෙහිව කටයුතු කරන නිසි අධිකාරීන් වෙත යොමු කිරීමට යෝග්‍ය යොමු කිරීම යාන්ත්‍රණයක් ඇතිකල යුතුය. මෙම අවස්ථා දෙකෙහිදීම, පැමිණි රටෙහි අධිකාරීන් සමඟ සම්බන්ධවීම මගින් සරණාගතයන් වන අයව අවධානමකට ලක් නොවන බවට වග බලා ගත යුතුය.

### හොඳුවාවඃ හඳුනාගැනීමේ ක්‍රියාපටිපාටීන් මගින් සරණාගත පතන්නන් හට නිසි යොමු කිරීම් කරන බවට වගබලා ගැනීම

යම් පුද්ගලයෙකු සරණාගත ඉල්ලා සිටි අවස්ථාවක, හෝ යම් පුද්ගලයෙකු සරණාගතයෙකු බවට විශ්වාස කිරීමට හේතු ඇතිවිට, රාජ්‍යයන් මගින් ඔවුන් පැමිණි රටෙහි තානාපති නියෝජිතයන් හා සම්බන්ධ නොවිය යුතුය.

## C. විධිමත් සම්මුඛ පරීක්ෂණ

හඳුනාගනු ලබන විශේෂිත අවශ්‍යතා පදනම් කරගෙන, ලබාදෙන උපකාර සහ ආරක්ෂාව අවශ්‍ය ආකාරයට සකස් කර ගැනීම සඳහා විධිමත් සම්මුඛ සාකච්ඡා මගින් අවස්ථාව ලබාදේ. විධිමත් සම්මුඛ පරීක්ෂණයකදී සාක්ෂි ලබාදීම සඳහා ගොදුරුවූ අයට තමා අත්දකින ලද දෙයින් මිදීම සඳහා 'සහන කාලපරිච්ඡේදයක්' ලබාදිය යුතුය.[33] එක් එක් ගොදුරුවූ අයගේ හෝ මිනිස් ජාවාරමට ගොදුරුවූ බවට පූර්වානුමාන කරන අයගේ තත්වය සහ අවශ්‍යතා අනුව, සහන කාලපරිච්ඡේදය ආරම්භවීමට පෙර හෝ පසුව විධිමත් සම්මුඛ පරීක්ෂණ පැවැත්විය හැකිය. මෙය සිදුවිය යුත්තේ ගොදුරුවූ අය හට ආරම්භක උපකාර සහ ආරක්ෂාව ලැබීමෙන් පසු ගොදුරුවූ අය හට වඩා හොඳින් දායක වීමට හැකි අවස්ථාවකදීය.

32 Trafficking in Persons Protocol 14 වන වගන්තිය බලන්න. *Recommended Principles and Guidelines on Human Rights and Human Trafficking* (E/2002/68/Add.1), United Nations High Commissioner for Human Rights, Guideline 2(7) යන ලියකියවිලිද බලන්න.

33 සහන කාලපරිච්ඡේදය සම්බන්ධ වැඩි විස්තර සඳහා බලන්න, *Policy Guide on Protecting Victims of Trafficking*, Bali Process, 2015.

උපකාර සහ ආරක්ෂාව සපයාදීමෙන් පසු, තවදුරටත් කරන සම්මුඛ පරීක්ෂණ මගින් විමර්ශනාත්මක හෝ නඩු පැවරීමේ අරමුණු ඉටුකෙරේ. යම් පුද්ගලයෙකු මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකුද යන්න සනාථ කර ගැනීම සඳහා තොරතුරු රැස්කරගත හැකිවේ. සම්මුඛ පරීක්ෂණයට භාජනය කිරීම සඳහා, සම්මුඛ පරීක්ෂණයේ ශ්‍රව්‍ය හෝ දෘෂ්‍ය පටිගත කිරීමක් කිරීම සඳහා මිනිසුන් කැමැත්ත ලබාදිය යුතු අතර සම්මුඛ පරීක්ෂණයේ අරමුණ සහ ප්‍රතිඵල සම්බන්ධයෙන් අවබෝධයෙන් සිටිය යුතුය.[34] සම්මුඛ පරීක්ෂණයට භාජනය වුණු අයගේ පුද්ගලිකත්වය ආරක්ෂා කිරීම සඳහා සම්මුඛ පරීක්ෂණය සහ එහි පිටපත් සහ තැටිගතකිරීම් රහසිගතව තබාගත යුතුය. සම්මුඛ පරීක්ෂණය කරන අය ගොදුරුවූ අය කියන කථාව වෙනස්වීමට හේතුව අවබෝධකර ගැනීමට විශේෂයෙන් පුහුණු කල යුතු අතර විවිධ වයස්, විවිධ භාෂා කථා කරන අය, විවිධ සංස්කෘතික පසුබිම්වලින් පැමිණෙන අය, සහ චිත්ත පීඩාවට ලක්වූ අය සමග කටයුතු කිරීමට පුරුදු විය යුතුය. [35]

ක්‍රියාවලියේ මෙම අවස්ථාවේ ප්‍රතිඵලයක් වශයෙන් ගොදුරුවූ අයගේ ප්‍රකාශනයක් ලබා ගැනේ. අදාල සිදුවීම් හඳුනාගැනීමට හෝ ගොදුරුවූ අයගේ ප්‍රකාශනය සනාථ කිරීමට තොරතුරු සඳහාද වෙනත් සාක්ෂි මෙම අවස්ථාවේදී රැස්කර ගත යුතුය. සම්මුඛ පරීක්ෂණයේදී ලැබුණු තොරතුරු පදනම් කරගෙන පුද්ගලයන් සඳහා ඇති ආරක්ෂණ සැලසුම් අවශ්‍ය පරිදි වෙනස් කල යුතුය. විශේෂඥ සේවා සපයන්නන් හට යොමුකිරීම් කිරීම අවශ්‍ය විය හැකිය.

ඉහත 2.2 කොටසේ සාකච්ඡා කල ආකාරයට, අධිකාරීන්ව විශ්වාස කිරීමට ගොදුරුවූ අය තුල පැකිළීමක් තිබිය හැකිය. ගොදුරුවූ අයව සම්මුඛ පරීක්ෂණයකට භාජනය කිරීම අභියෝගාත්මක විය හැකි අතර, ගොදුරුවූවන් හට තව දුරටත් මානසික පීඩා සහ වික්ෂිප්තභාවය ඇතිකිරීම වැළැක්වීම සඳහා සංවේදීතාවය සහ ඉවසීම අවශ්‍යවේ. සම්මුඛ පරීක්ෂණය කරන අය විශ්වාසය සහ රහස්‍යභාවය වර්ධනය කර ගැනීමට අවධානය යොමුකල යුතුය. හැකි සෑම අවස්ථාවකම, සම්මුඛ පරීක්ෂණය කරන අය ගොදුරුවූ අයගේ අත්දැකීම මතක් කිරීම මගින් ඔවුන්ට චිත්ත පීඩා ඇති කිරීම, ඔවුන්ව ලැජ්ජාවට පත් කිරීම සහ/හෝ බලය නැතිකිරීම, හෝ තීරණ ගැනීමේදී ආත්ම විශ්වාසය අඩු වන දේ කිරීම නොකල යුතුය. එසේ කිරීම මගින්ගොදුරුවූ අය හට තවදුරටත් හානි විය හැකි අතර, සාක්ෂි එකතු කිරීමට බාධා විය හැකි අතර ගොදුරුවූවන් යුක්තිය පසිඳලීමේ ක්‍රියාවලිය සමග සහයෝගයෙන් කටයුතු කිරීම අඩුවිය හැකිය.

## 3.3. මිනිස් ජාවාරම සම්බන්ධ දර්ශක

බොහෝ රාජ්‍යවල, මිනිස් ජාවාරම සම්බන්ධ විය හැකි තත්වයන් හඳුනා ගැනීමට සම්මත දර්ශක කට්ටලයන් භාවිතා කෙරේ. එම දර්ශකයන් විශේෂිත පාර්ශවකරුවන්ගේ හැකියාව වර්ධනය කිරීම සහ ඔවුන්ව පුහුණු කිරීම සඳහා ප්‍රයෝජනවත් වෙමෙලම්බවන අතර (උදාහරණ වශයෙන්, වෛද්‍ය වෘත්තිකයන් මෙන්ම පොලිස්, සංක්‍රමණ සහ රේගු නිලධාරීන්) මිනිස් ජාවාරම සිදුකරන තත්වයන් හා සම්බන්ධවන අවස්ථා විය හැකිය (උදාහරණ වශයෙන්, ගොදුරුවන අය අනුකූලව කටයුතු කරන බවට වගබලා ගැනීමට ජාවාරම්කරුවන් විසින් භාවිතා කරන ක්‍රම) නැතහොත් විශේෂිත සූරාකෑම් ආකාරයක් (උදාහරණ වශයෙන්, බලෙන් ශ්‍රමය ලබා ගැනීම) විය හැකිය. ප්‍රායෝගික වශයෙන්, මිනිස් ජාවාරමට ගොදුරුවන අයව බොහෝ අවස්ථාවලදී හඳුනා ගන්නේ ඔවුන්ව සූරාකෑමට ලක්වූ පසු වන බැවින්, සූරාකෑමේ අවධියට සම්බන්ධ දර්ශක වඩා විශ්වාසදායක ලෙස සැලකේ.

### හෝඩුවාවः දර්ශකයන් මැන බැලීම සලකා බලන්න

සමහර තොරතුරු සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සඳහා ගොදුරුවූ අයව හඳුනා ගැනීම සම්බන්ධ වගකීම ඇති අයට උපකාර ලබාදීම සඳහා රාජ්‍යයන් මගින් දර්ශකයන් මැන බැලීම සලකා බැලිය යුතුය. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ යුරෝපීය කොමිසම විසින් ගනු ලබන ප්‍රවේශය වන්නේ සෑම දර්ශකයක්ම ශක්තිමත්, මධ්‍යම හෝ දුර්වල ලෙස හඳුනාගැනීමයි. මෙයින් අදහස් වන්නේ එක් දර්ශකයක් දරුවන් සම්බන්ධයෙන් ශක්තිමත් වන අතර වැඩිහිටියන් සඳහා මධ්‍යම වන බව හෝ ලිංගික සූරාකෑම් සඳහා මධ්‍යම වන අතර ශ්‍රමය සූරාකෑම සඳහා දුර්වල වන ලෙසත්ය.

කෙසේවුවද, දර්ශකයන්ට ආවේණික සීමාවන්ද සැලකිල්ලට ගත යුතුය. මිනිසුන්ව ජාවාරම් කරන විවිධ ආකාර සහ ඔවුන්ව සූරාකෑමට ලක් කරන විවිධ අවස්ථාවන් සැලකිල්ලට ගැනීමේදී, සමහර දර්ශකයන් මගින් වෙනත් දර්ශකවලට වඩා මිනිස් ජාවාරම සිදුවුණු බට යෝජනා කෙරේ. වෙනත් වචනවලින් කිවහොත්, මිනිස් ජාවාරම් කරන එක අවස්ථාවකදී මූලික ෙ ලස කටයුතු කරන දර්ශකයක්, වෙනත් අවස්ථාවකදී සම්පූර්ණයෙන් නොතිබීම හෝ අදාල නොවිය හැකිය. උදාහරණ වශයෙන්, සෑම දිනකම සීමාසහිත වේතනයකට, ආයුධ සන්නද්ධ මුරකරුවන් යටතේ අධික පැය ගණනක් වැඩ කරන පුද්ගලයෙකු සම්බන්ධයෙන් ඇති දර්ශකයක් දේශසීමාවක් ඔස්සේ ගමන් බලපත්‍රයක් නොමැතිව දරුවෙකු ගෙනයාමට වඩා ශක්තිමත් දර්ශකයක් වනු ඇත.

34 සාමාන්‍යයෙන්, දරුවන් හට නෛතික කැමැත්ත ලබාදිය නොහැකිය. ළමුන් සමග කරන ඕනෑම සම්මුඛ පරීක්ෂණයකට පෙර, දෙමාපියන්ගෙන් හෝ භාරකරුවන්ගෙන් කැමැත්ත ලබාගැනීම සම්බන්ධ කාර්‍යපටිපාටිය නිර්ණය කල යුතුය.

35 බලන්න *Anti-Human Trafficking Manual for Criminal Justice Practitioners, Module 8: Interviewing victims of trafficking who are potential witnesses*, UNODC, 2009.

සමහර දර්ශකයන් මගින් වෙනත් ආකාරයේ අපරාධ සිදුවී ඇති බවට යෝජනා විය හැකි අතර, මිනිස් ජාවාරම සිදු වුණිද නොවුනිද යන්න තීරණය කිරීමේදී යම් දර්ශකයක් ඇතිද නැතිද යන්න තීරණාත්මක නොවේ.[36] තවත් සීමාවක් වන්නේ, ජාවාරම්කරුවන් දර්ශකයන්ට අනුවර්තනය විය හැකි අතර ඒ අනුව කටයුතු කිරීමවේ. උදාහරණ වශයෙන්, අධිකාරීන්ගේ සැකය ඇති නොවන ආකාරයට ගොදුරුවන්නන් හට ඔවුන්ගේ ගමන් සහ අනන්‍යතා ලියකියවිලි සඳහා ප්‍රවේශය ලබාදීම. මෙම සීමාවන් අනුව, එක් දර්ශකයක් මත විශ්වාසය තබනවා වෙනුවට විවිධ 'ආකාරයේ' දර්ශක භාවිතා කිරීම මගින් සත්‍ය වශයෙන් සිදුවන දෙය සම්බන්ධ මනා වැටහීමක් ලබාදේ. තවදුරටත්, දර්ශක ජාවාරම සම්බන්ධ සාක්ෂි නොවන අතර, ගොදුරුවූ අයෙකු හට ලබාදෙන උපකාර සහ ආරක්ෂාව සාධාරණීකරණය කිරීම සඳහා පූර්වානුමිතියක් පමණක් ඇතිකල හැක.

පහත ඇති සම්පූර්ණ නොවන දර්ශක ලැයිස්තුව මගින් මිනිස් ජාවාරම සම්බන්ධ ප්‍රොටෝකෝලයේ දක්වා ඇති විවිධ ආකාර සූරාකෑම් ආකාර සම්බන්ධයෙන් හැඟවීමක් ලබාදෙන අතර ඉහත ඇති සීමාවාන් ආශ්‍රයෙන් දැකිය යුතුය. ප්‍රොටොකෝලයේ ඇති සූරාකෑම් ආකාර සම්පූර්ණ නොවන බැවින්, වෙනත් ආකාරවල සූරාකෑම් ප්‍රායෝගිකව දිගින් දිගටම දකින අතර ඒවා පහතින් දක්වා ඇත. දර්ශකවල සඳහන් කර ඇති පුද්ගලයා මිනිස් ජාවාරමට ගොදුරුවූ බවට පූර්වානුමාන කරන අය මිස, ජාවාරම්කරු නොවේ.

## හෝඩුවාව: අවශ්‍ය තත්වයට අනුව දර්ශක ගැඩගස්සවා ගැනීම

දර්ශක ලැයිස්තුව බොහෝ කාර්‍යක්ෂම වන්නේ බලධාරීන් විසින් රාජකාරි කටයුතු කරන අතරතුර මුහුණ දෙන විශේෂිත අවස්ථාවන්ට අනුව අනුවර්තනය වන විටය. වෙනස්වන මිනිස් ජාවාරම් ප්‍රවණතාවලට දිගින් දිගටම අදාල වන අකාරයට රාජ්‍යයන් මගින් සිය දර්ශක ලැයිස්තු යාවත්කාලීන කරගත යුතුය.

## සූරාකෑමේ ඇති බහුල ප්‍රධාන දර්ශක

පහත දක්වා ඇති දර්ශක ඕනෑම ආකාරයක සූරාකෑමකට අදාල විය හැකිය. සමහර දර්ශක සූරාකෑම සම්බන්ධ ලක්ෂණවලට යොමුවන අතර සමහර ඒවා මගින් ජාවාරම්කරු සැකකරන ගොදුරුවූ අය කෙරෙහි ඇති පාලනය සම්බන්ධ ලක්ෂණ පෙන්විය හැකඃ

- අදාල පුද්ගලයා හට අදාල තත්වයේ සිටීමට බලකිරීම/අයුතු බලපෑම් කිරීම
- අදාල පුද්ගලයාව තත්වයේ ස්වරූපය/ස්ථානය සම්බන්ධයෙන් රැවටීම
- අදාල පුද්ගලයා විසින් වැඩකරන දින සහ පැය ගණන අධිකවීම
- අදාල පුද්ගලයා ජීවත්වන හෝ වැඩකරන තත්වයන් අමානුෂික සහ/හෝ තත්වය පහළට ඇද දමන ආකාරයේ වීම
- අදාල පුද්ගලයා වෙනත් අයගේ දැඩි පාලනයේ සිටීම හෝ අනෙක් අයගෙන් යැපීම
- අදාල පුද්ගලයා තර්ජනවලට හෝ හිංසාවට ලක්වීම
- අදාල පුද්ගලයා සිය වයසට සුදුසු නැති තත්වයක සිටීම

## විශේෂිත ආකාරයේ සූරාකෑම් සම්බන්ධ වැදගත් දර්ශකයන්

පහත ඇති දර්ශකයන් මිනිසුන් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලයේ ඇති විශේෂ ආකාරයේ සූරාකෑම් හා සම්බන්ධවේ. ප්‍රොටොකෝලයේ ඇති සූරාකෑම් ආකාර ලැයිස්තුව සම්පූර්ණ නොවන නිසා, එදිනෙදා ප්‍රායෝගිකව හමුවන වෙනත් ආකාරවල සූරාකෑම්ද පහත දක්වා ඇත.

36 බලන්න *Anti-human trafficking manual for criminal justice practitioners*, UNODC/UN.GIFT, 2009, Module 2. Also see *National Referral Mechanisms: A Practical Handbook*, OSCE, 2004, p.61.

**වෙනත් අයගේ ගණිකා වෘත්තිය සුරාකෑමට ලක් කිරීම සහ වෙනත් ආකාරවල ලිංගික සුරාකෑම් ආකාර**

1 වන වගුවේ දක්වා ඇති ආකාරයට (1.1 වගන්තිය) ලිංගික කර්මාන්තයේ නියැලෙන සියළුම අය මිනිස් ජාවාරමට ලක්වූ අය නොවේ. පහත ඇති දර්ශකයන් මගින් මිනිස් ජාවාරමට ගොදුරුවූ බවට පූර්වානුමාන කල අයව හඳුනාගැනීමට වැදගත්වේ:

- අදාල පුද්ගලයා විසින් සේවාදායකයන්ට සේවා ලබාදීම, විශේෂිත ලිංගික ක්‍රියාවල නිරතවීම හෝ අනාරක්ෂිත ලිංගික ක්‍රියාවල යෙදීම ප්‍රතික්ෂේප කල නොහැකිවීම
- අදාල පුද්ගලයා සේවාදායකයාගෙන් කෙළින්ම මුදල් ලබා නොගනී/සේවාදායක විසින් සේවායෝජක හෝ අතරමැදියන් හට ලබාදුන් මුදලින් ඉතා සුළු කොටසක් ලැබීම
- අදාල පුද්ගලයා හට විශේෂිත ගැබ්ගැනීම වළක්වන ක්‍රම භාවිතා කිරීමට හෝ නොකිරීමට බලපෑම/අයුතු බලපෑම් කිරීම
- අදාල පුද්ගලයා හට වෛද්‍ය/ගැබ්ගැනීම සම්බන්ධ පරීක්ෂණ කර ගැනීමට බලපෑම්/අයුතු බලපෑම් කිරීම
- අදාල පුද්ගලයා වයසින් අඩු අයෙකුවීම

**ඉන්ද්‍රියන් ඉවත්කර ගැනීමේ අරමුණින් කරන මිනිස් ජාවාරම**

පහත දර්ශකයන් ප්‍රාථමික වශයෙන් අදාලවන්නේ වෛද්‍ය කරුණු සඳහා ඉන්ද්‍රියන් ඉවත් කරන හෝ ඉවත් කර අවසන් තත්වයන් සම්බන්ධයෙන්වේ. මේවා සංස්කෘතික සහ චාරිත්‍ර පිළිවෙත් සම්බන්ධ කරන ඉන්ද්‍රිය ඉවත් කිරීම් සම්බන්ධයෙන් අදාල වන්නේ අඩු වශයෙනි:

- අදාල පුද්ගලයා හට ඉන්ද්‍රිය ඉවත් කිරීමට බලෙන්/අයුතු බලපෑම් කර කැමැත්ත ලබා ගැනීම
- අදාල පුද්ගලයාව සිදුකරන සැත්කම හෝ ඉන්ද්‍රිය ඉවත් කිරීම සම්බන්ධයෙන් ලබාදෙන වන්දි සම්බන්ධයෙන් රැවටීම
- අදාල පුද්ගලයා ඉන්ද්‍රිය බද්ධ කිරීම සිදුවන ස්ථානය හෝ වේලාව නොදැනීම
- අදාල පුද්ගලයා බද්ධ කිරීමේ ක්‍රියාවලිය හෝ ඒ හා සම්බන්ධ අවධානම් ගැන අවබෝධයක් නොමැතිවීම
- මෙයට සම්බන්ධවන තුන්වන පාර්ශවයක් සිටින බව පෙනීම
- අදාල පුද්ගලයා සමග ඉන්ද්‍රිය ලබා ගැනීමට බලාපොරොත්තුවන අය විදේශයකට ගමන් කිරීමට බලාපොරොත්තුවෙන් සිටීම

**ගෘහස්ථ පරවශතා සම්බන්ධයෙන් කරන මිනිස් ජාවාරම**

- අදාල පුද්ගලයා හට දුර්වල තත්වයේ/ගුණාත්මක බවින් අඩු ආහාර ලබාදීම සහ මන්දපෝෂිතබව පෙන්වීම
- අදාල පුද්ගලයා අධික හෝරා ප්‍රමාණයක් වැඩ කිරීම
- අදාල පුද්ගලයා හට පුද්ගලික ඉඩ ප්‍රමාණයක් නොමැතිවීම, හෝ පුද්ගලික ඉඩ ප්‍රමාණය ප්‍රමාණවත් නොවීම
- අදාල පුද්ගලයා හට සමාජ අන්තර්ක්‍රියා සඳහා ප්‍රවේශය ලබා නොදීම සහ/හෝ සිය සේවායෝජකයා නැතිව කිසිවිටකත් නිවසින් පිටව නොයාම
- අදාල පුද්ගලයා අපහාස, අනිසි ලෙස භාවිතයට, තර්ජනවලට, හිංසනයට සහ/හෝ අතවරවලට ලක්වීම
- අදාල පුද්ගලයා සේවයකට යොදවා ගැනීමේ ගාස්තුවක් ගෙවීම
- අදාල පුද්ගලයා වයසින් අඩු අයෙකුවීම

**බලෙන් දාසත්වයට යෙදීමට හෝ කලින් විවාහ කරවීමේ අරමුණින් මිනිස් ජාවාරම කිරීම**

- විවාහය සිදුකිරීම සඳහා තුන්වන පාර්ශවයකට මුදල් හෝ වෙනත් ත්‍යාග ලබාදී තිබීම
- විවාහවූ පාර්ශවයන් නොමැතිව සහ/හෝ ඔවුන්ගේ සහභාගිත්වය හෝ එකගතාවය නොමැතිව වෙනත් අය විසින් විවාහ ගිවිසීම සම්බන්ධ ගනුදෙනු කර තිබීම
- අදාල පුද්ගලයාව ශ්‍රමය, ගෘහස්ථ පරවශතා හෝ ලිංගික සුරාකෑමට ලක්කරන තත්වයකට බලෙන් පත් කිරීම
- අදාල පුද්ගලයා කන්‍යාභාවය පිළිබඳ පරීක්ෂා ලබා තිබීම හෝ ඒවාට යටත්වීමට සිදුවීම
- අදාල පුද්ගලයාගේ ඥාතීන්ව විවාහයට බල කිරීම
- අදාල පුද්ගලයා අවපාතය, තමාට හානි කර ගැනීම, සමාජයෙන් හුදකලාවීම හෝ මත්කුඩු අනිසි ලෙස භාවිතා කිරීම සම්බන්ධ සලකුණු පෙන්වීම
- මේවා පවුල් අසමගිය, හිංසන හෝ අයුතු ලෙස පරිහරනය සම්බන්ධ සලකුණුවේ
- අදාල පුද්ගලයා වයසින් අඩු අයෙකුවීම

**හිගාකෑම සහ අපරාධ ක්‍රියාකාරකම් අරමුණු වෙනුවෙන් සූරාකෑම සඳහා මිනිස් ජාවාරම් කිරීම**

- අදාල පුද්ගලයා විසින් ප්‍රමාණවත් තරමට මුදල් රැස් නොකලහොත් හෝ සොරකම් නොකලහොත් ඔහුට දඬුවම් පැමිණවීම
- අදාල පුද්ගලයා ජීවත්වන්නේ සමාන ක්‍රියාකාරකම්වල නිරතවන අය සමඟය
- අදාල පුද්ගලයා ක්‍රියාකාරකම්වල අරමුණ හෝ එහි ඇති නීතිවිරෝධීභාවය අවබෝධ කරගෙන නොසිටීම
- අදාල පුද්ගලයා වයසින් අඩු, වයසින් වැඩි හෝ ආබාධිතවීම

ඉහතින් ඇති දර්ශක පහත දක්වා ඇති සූරාකෑම් ආකාරවලට අමතරව සෑම ආකාරයකම සූරාකෑම්වලට අදාල විය හැකිය.

***අපරාධ ක්‍රියාකාරකම්වලදී සූරාකෑමට ලක්වූ මිනිස් ජාවාරමට ලක්වූ අය හඳුනාගැනීමේදී ඇති අභියෝගයන්***

*අපරාධ ක්‍රියාකාරකම්වලදී සූරාකෑමට ලක්වූ අය මිනිස් ජාවාරමට ලක්වූ අය වශයෙන් නොව අපරාධකරුවන් වශයෙන් හඳුනා ගැනීමට ඉඩකඩ ඇත. මෙම අවදානම අඩුකර ගැනීම සඳහා, මිනිසා ජාවාරම්කරුවන් විසින් පුද්ගලයෙකුව පාලනය කිරීමට සහ සූරාකෑමට ලක්වන තත්වයක තැබීමට භාවිතා කරන ආකාර සහ සූරාකෑම සම්බන්ධයෙන් ගොදුරුවූ අයෙකුගේ කැමැත්ත අදාල නොවීම සම්බන්ධයෙන් ප්‍රමාණවත් ලෙස පුහුණුව ලබාදිය යුතුය.*

## සැකකරනු ලබන මිනිස් ජාවාරම්කරු විසින් භාවිතා කරන ක්‍රම

මිනිසුන් ජාවාරම් කිරීම සම්බන්ධ ප්‍රොටොකෝලයේ දක්වා ඇති ක්‍රම මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධ දර්ශකවේ. ප්‍රොටොකෝලය යටතේ ගොදුරුවන අය දරුවන් වන විට, මිනිස් ජාවාරම් කිරීම යන අපරාධය සඳහා ක්‍රම අවශ්‍ය අංගයක් නොවේ. කෙසේවුවද, එවා භාවිතා කිරීම මගින් මිනිස් ජාවාරම හෝ අදාල සූරාකෑම සිදුවන බවට හැඟවීමක් කරයි. සේවයේ යොදවා ගැනීම, ප්‍රවාහනය, මාරුකිරීම, ලඟ තබා ගැනීම හෝ පුද්ගලයෙකු ලබා ගැනීම, සිට ඔහුව හෝ ඇයව සූරාකෑමේ අවස්ථාවේදී පාලනය කිරීම, සහ ගොදුරුවූ අයව සූරාකෑමකට භාජනය කිරීම සඳහා මිනිස් ජාවාරම් ක්‍රියාවලියේ ඕනෑම අවස්ථාවක ක්‍රම භාවිතා කල හැකිවේ. සමහර භාවිතා කරන ක්‍රම හඳුනාගැනීම ඉතා පහසු වුවද (උදාහරණ වශයෙන්, බලය පාවිච්චි කිරීම), සමහර අවස්ථාවලදී ක්‍රම ඉතාම සියුම් වන අතර හඳුනා ගැනීමට අපහසුවේ (උදාහරණ වශයෙන්, බලය අයුතු ලෙස පාවිච්චි කිරීම හෝ දුර්වල තත්වයක්).

පහත ඇති සම්පූර්ණ නොවන ලැයිස්තුව මගින් මිනිස් ජාවාරම යන අපරාධයේ මෙම අංගය ස්ථාපනය කිරීමට උපකාර කිරීමට මිනිස් ජාවාරම සම්බන්ධ තිබිය හැකි හැඟවීම් ලබාදේ:

**තර්ජන**

- අදාල පුද්ගලයා හට (හෝ ඔහු හෝ ඇයගේ පවුලේ අය, මිතුරන් සහ ප්‍රජාව) තර්ජනය කිරීම
- අදාල පුද්ගලයා හට (හෝ ඔහු හෝ ඇයගේ පවුලේ අය, මිතුරන් සහ ප්‍රජාව) බලය සහිතව තර්ජනය කිරීම
- අදාල පුද්ගලයා හට (හෝ ඔහු හෝ ඇයගේ පවුලේ අය, මිතුරන් සහ ප්‍රජාව) ජීවන හෝ වැඩකරන තත්වය නරක අතට හරවන බවට තර්ජනය කිරීම
- අදාල පුද්ගලයා හට (හෝ ඔහු හෝ ඇයගේ පවුලේ අය, මිතුරන් සහ ප්‍රජාව) අධිකාරීන් හට අල්ලා දෙන බවට තර්ජනය කිරීම
- අදාල පුද්ගලයා හට (හෝ ඔහු හෝ ඇයගේ පවුලේ අය, මිතුරන් සහ ප්‍රජාව) බලය සහිතව තර්ජනය කිරීම

**බලය භාවිතා කිරීම**

- අදාල පුද්ගලයා ශාරීරික හානි සම්බන්ධ සළකුණු පෙන්වීම
- අදාල පුද්ගලයා මානසික සහ මනෝවිද්‍යාත්මක හානි සම්බන්ධ සළකුණු පෙන්වීම
- අදාල පුද්ගලයා ලිංගික අතවර සහ/හෝ ලිංගික වශයෙන් දූෂණය සම්බන්ධ සළකුණු පෙන්වීම

**අයුතු බලපෑම් කිරීම**

- අදාල පුද්ගලයා හට පවුලේ හෝ ආර්ථික ප්‍රශ්න තිබීම
- අදාල පුද්ගලයා සම්බන්ධයෙන් අපරාධ ඉතිහාසයක් තිබීම හෝ නැතිනම් අධිකාරීන් අදාල පුද්ගලයා ගැන දැන සිටීම
- අදාල පුද්ගලයා සම්බන්ධයෙන් අවිධිමත් සංක්‍රමණ තත්වයක් සහ/හෝ ලියකියවිලි රහිතවීම
- අදාල පුද්ගලයාගේ ලියකියවිලි, මුදල් හෝ වෙනත් දේ රාජසන්තක කර තිබීම
- අදාල පුද්ගලයා විසින් අසාධාරණ ණය වැඩපිළිවෙළකට ඇතුළුවී සිටීම
- අදාල පුද්ගලයා  හුදෙකලාව සිටීම, එක් තැනක සිටීම, සහ/හෝ මුරකිරීමට යටත්ව සිටීම
- අදාල පුද්ගලයා ගේ සංස්කෘතික හෝ ආගමික විශ්වාසයන් වෙනත් අයට අවශ්‍ය ආකාරයට හැසිරවීම

**පැහැරගෙන යාම**

**වංචාව/රැවටීම යම් කරුණු (සාවද්‍ය, නිවැරදි නොවන, අසම්පූර්ණ, නොමග යවන සුළු තොරතුරු) පහත දෑ:**

- අදාල පුද්ගලයා සම්බන්ධ සංක්‍රමණ ක්‍රියාවලිය හෝ එහි සාර්ථකත්වය (ගමනාන්තය ඇතුළු)
- අදාල පුද්ගලයාගේ ගමන් සහ රැකියාවලට බඳවා ගන්නා තත්වයන්
- අදාල පුද්ගලයාගේ රැකිරක්ෂා තත්වයන්, මෙයට ඇතුළුවන්නේ: රැකියාවේ වර්ගය, ගෙවීම, වේතන, ආදායම, ඉපයීම්
- අදාල පුද්ගලයා හට ප්‍රවේශය ඇති අධ්‍යාපන අවස්ථා
- අදාල පුද්ගලයාගේ නිවාස, සිටින ස්ථාන හෝ ජීවන තත්වයන්
- අදාල පුද්ගලයාගේ ලියකියවිලිවල, සංක්‍රමණ තත්වයේ, රාජකාරිවල හෝ ගිවිසුමේ නීත්‍යානුකූලබව
- අදාල පුද්ගලයා සම්බන්ධ නීති, සහ අධිකාරීන් එම අය කෙරෙහි දක්වන ආකල්ප හෝ හැසිරීම
- අදාල පුද්ගලයා හට නැවත පවුල සමඟ එක්වීමට, විවාහයට හෝ දරුකමට හදා ගැනීමට ඇති අවස්ථා

**පහත කරුණු වැරදි ආකාරයට භාවිතා කරමින්, බලය අයුතු ලෙස භාවිතා කිරීම හෝ දුර්වල තත්වයකට පත් කිරීම [37]:**

- අදාල පුද්ගලයා සුරාකන අය/සේවායෝජකයා/පවුලේ අයගෙන් ආර්ථික, මනෝවිද්‍යාත්මක හෝ ආවේගශීලි ලෙස යැපීම, හෝ එම අය සමඟ ඇති එවැනි සම්බන්ධතාවය
- සුරාකන අය/සේවායෝජකයා/පවුලේ/වෙනත් අය සමඟ අදාල පුද්ගලයා හට ඇති ආවේගාත්මක බැඳීම
- අදාල පුද්ගලයාගේ සංක්‍රමණ ලියකියවිලි සහ/හෝ තත්වය
- අදාල පුද්ගලයාගේ සමාජ, සංස්කෘතික හෝ භාෂාමය වශයෙන් හුදෙකලාවීම
- අදාල පුද්ගලයාගේ විරැකියාව හෝ ආර්ථික වශයෙන් දුගීබව
- අදාල පුද්ගලයාගේ මානසික හෝ ශාරීරික ආබාධිතතා
- අදාල පුද්ගලයාගේ වයස (තරුණද වයසද යන්න), ස්ත්‍රී පුරුෂ බව, ලිංගය, ලිංගික සම්භවය, ජාතිකත්වය, වාර්ගික හෝ සමාජ සම්භවය, සහ ආබාධිත බව
- අදාල පුද්ගලයාගේ සංස්කෘතික සහ ආගමික විශ්වාස, චතාවත් හෝ පුහුණු
- අදාල පුද්ගලයා මත්ද්‍රව්‍ය මත යැපීම හෝ ඇබ්බැහිය

**වෙනත් අයෙකු සම්බන්ධයෙන් පාලනය ඇති අයෙකුගේ කැමැත්ත ලබා ගැනීම සඳහා ගෙවීමක් හෝ ප්‍රතිලාභ ලබාදීම හෝ ලබා ගැනීම:**

- අදාල පුද්ගලයා ගාස්තු, දෑවැදි හෝ තුන්වන පාර්ශවයනට ත්‍යාග දීම හෝ ලබා ගැනීම කරන තත්වයක සිටීම

37 බලන්න *Abuse of a Position of Vulnerability and other "means" within the definition of trafficking in persons*, UNODC, 2012 and Guidance හි සටහන *'abuse of a position of vulnerability' as a means of trafficking in persons in Article 3 of the Protocol to Prevent, Suppress and Punish Trafficking in Persons, Especially Women and Children, supplementing the United Nations Convention against Transnational Organized Crime*, UNODC, 2012.

3 වන කොටස

## පූර්වානුමාන කල ගොදුරුවූ අය විදේශ රාජ්‍යයක් වෙත ගමන් කරන, ඇතුළුවන, හෝ රැඳී සිටින ආකාරය

යම් පුද්ගලයෙකු ජාතීන් අතර මිනිස් ජාවාරමට ගොදුරුවූ බවට සැක කරන අවස්ථාවක, ඇය හෝ ඔහු විදේශ රාජ්‍යය වෙත ගමන් කල ආකාරය, ඇතුළුවූ ආකාරය, හෝ රැඳී සිටින ආකාරය මගින් පූර්වානුමාන කල මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු වශයෙන් ඔහුගේ හෝ ඇයගේ තත්වය සම්බන්ධයෙන් අවබෝධයක් ලබාගත හැකිය:

- අදාල පුද්ගලයාගේ ගමන් හෝ අනන්‍යතා ලියකියවිලි රැගෙන එම/ඉදිරිපත් කිරීම තුන්වන පාර්ශවයක් මගින් සිදු කිරීම
- රැකියා නියෝජිතයන් සහ ගමන් නියෝජිතයන් ලියාපදිංචි නොවී සහ/හෝ විධිමත් නොවූ සහ/හෝ සේවකයා සඳහා අධික ගාස්තු අය කිරීම
- ඇතුළුවීම සඳහා වූ වීසා බලපත්‍රය අදාල නොවීම සහ/හෝ ගමනේ අරමුණ වෙනත් තොරතුරු සමග නොගැලපීම (උදාහරණ වශයෙන්, නැවතී සිටින කාලය සහ ප්‍රමාණවත් නොවන මුදල්, ගමන් කරන අයගේ ශාරීරික තත්වය, හෝ ප්‍රකාශ කරන ලද වෘත්තීය)
- අදාල පුද්ගලයාගේ ගමන් මළු ගමන් කරන අය කල ප්‍රකාශනය සමග නොගැලපීම (උදාහරණ වශයෙන්, ගමන් මල්ලේ ආකාරය සහ ගුණාත්මකබව, යෝජිත දිගගු ගමනක් සඳහා කුඩා මල්ලක් හෝ යෝජිත කෙටි ගමනක් සඳහා විශාල මල්ලක්)
- අදාල පුද්ගලයා ගමන් කරන කණ්ඩායම ඔහු හෝ ඇය නොදන්න කණ්ඩායමක් බව පෙනීම
- අදාල පුද්ගලයා හට ව්‍යාජ අනන්‍යතා, රාජකාරි සහ/හෝ ගමන් ලියවිලි තිබීම සහ/හෝ ගමන් කරන අය විසින් ලබාදුන් තොරතුරු විශ්වාසනීය නොවීම
- අදාල පුද්ගලයා ඔහුගේ හෝ ඇයගේ ගමන් මාර්ගය, ගමනාන්තය හෝ ගමනේ අරමුණ සම්බන්ධයෙන් ව්‍යාකූලවී සිටීම
- අදාල පුද්ගලයා අවිධිමත් සංක්‍රමණ/නේවාසික තත්වයක සිටීම (අනන්‍යතා ලියකියවිලි රාජසන්තක කිරීම හෝ රැකියාවෙන් පහකිරීම ඇතුළුව)

## ගොදුරුවූ බවට පූර්වානුමාන කරන අයගේ ශාරීරික තත්වය

බොහෝ ගොදුරුවූවන් මිනිස් ජාවාරම කරන අතර දරුණු මානසික සහ කායික හානිවලට භාජනයවේ. පුද්ගලයෙකුව හමුවන විට ඔහුගේ හෝ ඇයගේ ශාරීරික තත්වය මගින් එම අය මිනිස් ජාවාරමට ලක්වූණිද යන්න නිගමනයකට පැමිණිය හැකිය. මිනිස් ජාවාරමට ගොදුරුවූ බොහෝ දෙනෙකු එවැන්නකට ගොදුරුවූ අය ලෙස හඳුනා ගැනීම නොකරන අතර සිය තත්වය සම්බන්ධයෙන් සෑහීමට පත්වී සිටින බවට සටහන් කර තැබීම වැදගත්වේ.[38] යම් පුද්ගලයෙකු තමුන්ගේ තත්වය සම්බන්ධයෙන් සෑහීමට පත්ව සිටින්නේය යන්න අවධාරණය කිරීම මගින්ම මිනිස් ජාවාරම් කල අය කොතරම් දුරට ඔවුන්ව වැරදි ආකාරයට මෙහෙයවා ඇතිද යනන්න සාක්ෂියක්වේ.

**මානසික තත්වය සහ හැසිරීම පිළිබඳ සළකුණු:**

- අදාල පුද්ගලයා කැළඹිල්ලෙන්, පීඩිතව, බියෙන්, ආවේගයෙන් සහ භීෂණයෙන් සිටින බව පෙනීම
- අදාල පුද්ගලයා මුහුණ දෙස බලාගෙන කථා කිරීම ප්‍රතික්ෂේප කිරීම
- අදාල පුද්ගලයා සිදුව ඇති හානි සම්බන්ධ කථා කිරීමට හෝ සාකච්ඡා කිරීමට පැකිළේ

**වැරදි ලෙස සැලකූ බවට සහ/හෝ නොසලකා සිටි බවට ශාරීරික ලකුණු:**

- අදාල පුද්ගලයා ශාරීරික හිංසන සම්බන්ධ සළකුණු පෙන්වයි
- අදාල පුද්ගලයා මත්ද්‍රව්‍ය හෝ මත්ධ්‍යසාර වලට ඇබ්බැහිබව/යැපෙන බව/භාවිතා කරන බවට සළකුණු පෙන්වයි
- අදාල පුද්ගලයා දුෂ්පෝෂණය, හෝ ආහාර, ජලය, නින්ද, වෛද්‍ය රැකවරණ හෝ වෙනත් ජීවිතයට අවශ්‍ය දේ නැතිවීම හේතුවෙන් පෙන්වන වෙනත් ශාරීරික ලක්ෂණ පෙන්වීම
- අදාල පුද්ගලයා සේදීම සහ/හෝ සනීපාරක්ෂක පහසුකම් නොමැතිවීම නිසා පෙන්වන ලක්ෂණ පෙන්වීම

38 2.2 කොටස බලන්න

## පූර්වානුමාන කල ගොදුරුවූ අය ජීවත්වන සහ/හෝ වැඩකරන ස්ථානයේ ඇති තත්වයන්

ජීවත්වන සහ/හෝ වඩකරන තත්වයන් සම්බන්ධ දර්ශකයන් මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව සුරාකෑම හා සම්බන්ධවේ. ලිංගික කර්මාන්තය, මෙන්ම ගෘහස්ථ වැඩ, ළමා රැකවරණ, සෞඛ්‍යය සේවා, වැඩිහිටියන් රැකබලා ගැනීම, ක්‍රීඩා, විනෝදවීම, ආගන්තුක සත්කාර, ඉදිකිරීම්, වනවගා, කැණීම්, කෘෂිකර්මාන්තය, සහ රෙදිපිළි කර්මාන්තය ඇතුළු කර්මාන්තවල පූර්වානුමාන කල ගොදුරුවූවන් සොයා ගත හැකිය. පහත ඇති දර්ශකයන් පූර්වානුමාන කල මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු ජීවත්වන සහ/හෝ වැඩකරන සියළුම තත්වයන්ට අදාලවේ.

**ගෙවීම සහ ගිවිසුම්:**

- උපයන සහ ඉතිරිකරන දේ තබාගැනීමට සහ/හෝ මාරුකර යැවීමට අදාල පුද්ගලයාට තහනම්වීම
- ඇය හෝ ඔහු කරන රාජකාරි සම්බන්ධයෙන් ඉතා සුළු ගෙවීමක් කිරීම හෝ කිසිම ගෙවීමක් නොකිරීම හෝ ගෙවීම ප්‍රමාද කිරීම
- පොරොන්දුවූ වේතන හෝ ජාතික අවම වේතනවලට සාපේක්ෂව අඩු ගෙවීමක් අදාල පුද්ගලයා හට ගෙවීම
- සේවායෝජකයන්/රැකියා නියෝජිතයන් හට ගෙවීම සඳහා අදාල පුද්ගලයාගේ වැටුපින් අධික ලෙස මුදල් අඩු කිරීම
- පුද්ගලයා හට නීතියෙන් හිමිකම් ඇති ප්‍රතිලාභ සහ සමාජ ආරක්ෂණ ලබා නොදීම
- අදාල පුද්ගලයා ගිවිසුමක් අත්සන් නොකිරීම හෝ ගිවිසුමේ ඇති කොන්දේසිවලට ගරු නොකිරීම
- රාජ්‍යයට පැමිණි පසු සහ/හෝ රැකියාව ඇරඹීමෙන් පසු පුද්ගලයා හට  අළුත් ගිවිසුමක් අත්සන් කිරීමට ලබාදීම
- සේවකයන් හට වේතන ගෙවූ බවට සාක්ෂි පෙන්වීමට සේවාදායක හට නොහැකිවීම
- හේතුවක්, දැන්වීමක් සහ/හො ප්‍රතිලාභ නොමැතිව පුද්ගලයාව රැකියාවෙන් ඉවත් කිරීම

**රාජකාරී ස්ථානයේ සෞඛ්‍යය සහ ආරක්ෂාව:**

- පුද්ගලයා හට නිසි ආරක්ෂක උපකරණ ලබා නොදී හෝ එවා භාවිතා කරන ආකාරය උගන්වා නොසිටීම
- අදාල පුද්ගලයා හට වෛද්‍ය රැකවරණ සඳහා ප්‍රවේශය ලබා නොදීම
- අදාල පුද්ගලයා ඉතා අධික ලෙස දිගු/අසාමාන්‍ය ලෙස වැඩ කිරීම
- අදාල පුද්ගලයා හට විවේකයක් නොමැතිවීම හෝ ඉතා කෙටි විවේක ලබාදීම
- අදාල පුද්ගලයා හට ලබාදුන් ඉලක්ක කරා ලඟාවීමට අසමත්වීම  හේතුවෙන් දඩුවම්/දඩවලට භාජනය වීම

**එහාමෙහා යාමට ඇති සීමා සහ අඩු පහසුකම්:**

- අදාල පුද්ගලයා විසින් භෞතික වශයෙන් රාජකාරී ස්ථානයට හෝ වෙනත් ස්ථානයකට සීමාවූ ලක්ෂණ පෙන්වීම (උදා: ආවරණය කල ජනේල, දොරවල් පිටතින් යතුරුදමා තිබීම, කටුකම්බි වැටවල්, ආරක්ෂණ කැමරා)
- අදාල පුද්ගලයා රාජකාරී කරන ස්ථානයේ නිදා ගැනීම
- අදාල පුද්ගලයා හට සන්නිවේදනය සඳහා ප්‍රවේශය ලබා නොදීම
- අදාල පුද්ගලයා හට සිය ගමන්/අනන්‍යතා ලියවිලිවල සන්තකය නැතිවීම, සහ/හෝ අදාල ලියකියවිලි සේවා යේජකයා හෝ වෙනත් අයෙකු විසින් රාජසන්තක කර තැබීම[39]

39 දර්ශක සම්බන්ධ වැඩිදුර තොරතුරු සහ සම්පත් සඳහා කරුණාකර Matrix of Resources බලන්න.

# 4 වන කොටස:

## මිනිස් ජාවාරමට ගොදුරුවන අය හඳුනා ගැනීම සම්බන්ධ හෝඩුවාවවන්ගේ සාරාංශය

- ✓ **මිනිස් ජාවාරමට ගොදුරුවූ බවට පූර්වානුමාන කරන අයට වාසි වන ආකාරයට පූර්වානුමිතියක් හඳුන්වාදීම:** ගොදුරුවූ අය හඳුනාගැනීම සම්බන්ධ රාජ්‍ය ප්‍රතිපත්ති මගින් මිනිස් ජාවාරමට ගොදුරුවූ අයෙකු වශයෙන් සැක කරන අයෙකු හට මූලික උපකාර සහ ආරක්‍ෂාව සැපයීමේ අරමුණ සම්බන්ධයෙන් ඔවුන් මිනිස් ජාවාරමට ලක්වූ අයෙකු යන පූර්වානුමිතිය මත අධිකාරීන් හට කටයුතු කිරීමට ඉඩකඩ ලබාදිය යුතුය.

- ✓ **මිනිස් ජාවාරමට අදාල අපරාධ සම්බන්ධ අවබෝධය ඇතිකිරීම:** මිනිස් ජාවාරමට ගොදුරුවූ ලෙස සලකනු නොලබන එහෙත් වෙනත් අපරාධවලට ගොදුරුවූ අයහට  උපකාර සහ ආරක්‍ෂාක විධිවිධාන අවශ්‍ය විය හැකිය. මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගැනීම සම්බන්ධයෙන් වගකීම ඇති වෘත්තීකයන් හට ආශ්‍රිත අපරාධ සම්බන්ධයෙන් දැනුවත් කල යුතු අතර අවශ්‍ය ආකාරයට ප්‍රතිචාර දැක්වීමට ඔවුන්ට අවශ්‍ය දේ ලබා දිය යුතුය.

- ✓ **දූර්වල කණ්ඩායම් අතර සිටින මිනිස් ජාවාරමට ලක්වූ ලෙස පූර්වානුමාන කල අයව හඳුනා ගැනීම:** වසොයාබැලීමේ අදියරට පෙර, මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගැනීම අතිශය දූෂ්කරවේ. සිය ප්‍රතිපත්ති අතරට මිනිස් ජාවාරමට ලක්කල සංක්‍රමණිකයන් ඇතුළු, මිනිස් ජාවාරමට ලක්විය හැකි අය අතර සිටින පූර් වානුමාන කල ගොදුරුවූ අය හඳුනා ගැනීමට අධිකාරීන් හට උපකාර කරන ප්‍රතිපාදන තිබිය යුතුය.

- ✓ **වහල්භාවය හඳුනාගැනීම:** වහල්භාවය සළකුණු කරන්නේ අපරාධය කරන අය සහ ඔහුගේ හෝ ඇයගේ අපරාධයට ලක්වූ අය අතර ඇති සම්බන්ධතාවයට වඩා අදාල තත්වයට සම්බන්ධ කරුණු මතය. වහල්භාවයට ලක්වූ අයෙකු පෙනෙන ආකාරයට සැපපහසු ජීවිතයක් ගත කලද, සිය ජීවිතය සම්බන්ධයෙන් මූලික තීරණ ගැනීමට ඇති නොහැකියාව අධිකාරින් විසින් අවබෝධ කරගත යුතුය.

- ✓ **ණයක් පියවීම සම්බන්ධයෙන් ඇති වහල්භාවය (debt bondage):** මිනිස් ජාවාරමට ලක්වූ බොහෝ අය අතර ණයක් පියවීම සම්බන්ධයෙන් ඇති වහල්භාවය බහුල අත්දැකීමකි. ණයක් පියවීම සම්බන්ධයෙන් ඇති වහල්භාවය හඳුනාගත හැක්කේ නිර්ණය කල නොහැකි ණයක් පැවතීම සහ කොතරම් වැඩ කලත් සේවා සැපයුවත් ගෙවා අවසන් කල නොහැකිවීම හේතුවෙනි. ණයක් ගෙවීම සඳහා සූරාකන ආකාරයට ශ්‍රමය හෝ සේවා ලබාදීම හේතුවෙන් බොහෝ අධිකරණ කලාප මගින් ණයක් පියවීම සම්බන්ධයෙන් ඇති වහල්භාවය බොහෝ පුළුල් ආකාරයට හඳුනා ගනී.

- ✓ **බලෙන් විවාහ සිදුකිරීම හඳුනාගැනීම:** කාන්තාවන් පමණක් බලෙන් විවාහවීම්වලට ලක්වන බව හඳුනාගනු ලබන වහල්භාවය සම්බන්ධ අනුපූරක ප්‍රඥප්තිය බලාත්මක වීමෙන් අනතුරුව, පිරිමි ළමුන් සහ මිනිසුන්ද බලෙන් කරන විවාහවලට ලක්විය හැකි බවට පුළුල් ලෙස පිළිගෙන ඇත. සියළුම ආකාරයේ බලෙන් සිදු කරන විවාහවලට එරෙහිව කටයුතු කිරීම සඳහා, ගොදුරුවන අයගේ ලිංගිකත්වය නොතකා බලෙන් සිදුකරන විවාහ තහනම් කරන නීතීන් සැමදෙනට එකසේ අදාල විය යුතු බවට වගබලා ගැනීම හොඳ පුහුණුවක් වශයෙන් සලකන ලදී.

- ✓ **දරුවන්ව සූරාකෑමට ලක්කිරීම සඳහා විකිණීම හඳුනා ගැනීම:** ළමුන් හෝ බිළිඳුන් විකිණීමේදී සූරාකෑම සිදුවීම විකිණීමට පසු සිදුවීම අවශ්‍ය නොවන බැවින්, මෙම සංකල්පය දරුකමට හදා ගැනීම සඳහා සහ වාණිජ ලෙස ගැබ් විකිණීම සම්බන්ධ වැඩපිළිවෙලටද අදාල කිරීමට රාජ්‍යයන් මගින් සලකා බැලිය යුතුය.[19]

- **විවිධ ආකාරයේ සූරාකෑම් සම්බන්ධයෙන් විශේෂිත දර්ශකයන් ඇතිකල යුතුය:** මුලින්ම ප්‍රතිචාර දක්වන අයට විවිධ ආකාරයේ සූරාකෑම් හඳුනා ගත හැකිවන ආකාරයට රාජ්‍යයන් මගින් අධිකාරීන් හට මිනිස් ජාවාරම් කිරීම සම්බන්ධ දර්ශකයන් ප්‍රමාණවත් ආකාරයට විස්තර කර දිය යුතුය. උපකාර සහ ආරක්ෂාව සැපයීමේදී, නිර්වචනයේ වෙනත් අංග සම්බන්ධ වැඩිදුර සාක්ෂි හෙළිදරව් විය හැකිය. 3.3 වගන්තිය මගින් විශේෂිත සහ විස්තරාත්මක දර්ශකයන් වර්ධනය කිරීම සම්බන්ධ පදනම පැහැදිලි කරදේ.

- **රඳවා තැබීම සහ රටින් පිටුවහල් කිරීම සම්බන්ධයෙන් ගොදුරුවූවන් හට ඇති ගැටළු ඉදිරිපත් කිරීමට ගොදුරුවූ අයව උනන්දු කිරීම:** ගොදුරුවූවන් හට ඇති රඳවා තැබීම සම්බන්ධයෙන් ඇති බිය සම්බන්ධයෙන් සැලකිල්ලට ගැනීම සඳහා, මිනිස් ජාවාරමට ලක්වීමේ ප්‍රතිඵලයක් වශයෙන් ඔවුන් විසින් කරන ලද, සංක්‍රමණ වැරදි ඇතුළු, අපරාධ වැරදි සම්බන්ධයෙන් ඔවුන්ව දඬුවමට ලක් නොකිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලසිය යුතුය. ගොදුරුවූ අය තුල ඇති රටින් පිටුවහල් කිරීම සම්බන්ධයෙන් කටයුතු කිරීමට, මිනිස් ජාවාරමට ලක්වූ අයහට අවසානයේ සිටින රටෙහි නැවතී සිට අවශ්‍ය උපකාර සහ ආරක්ෂාව ලබාගැනීම සඳහා වීසා මාර්ග ඇතිකල යුතුය.

- **මිනිස් ජාවාරමට ලක්වූ අය සහ ඔවුන්ගේ පවුලේ අයව ආරක්ෂා කිරීම මගින් ඔවුන් හට ඉදිරියට ඒමට උනන්දු කිරීම:** ගොදුරුවූවන්, සාක්ෂිකරුවන් සහ ඔවුන්ගේ පවුල්වල අයට කාර්යක්ෂම ලෙස ආරක්ෂාව ලබාදීම සඳහා අවශ්‍ය කටයුතු සම්පාදනය කිරීමට රාජ්‍යයන් මගින් සලකා බැලිය යුතුය. ආරක්ෂාව අවශ්‍ය අය වෙනත් රා-ජ්‍යයන්හි සිටින අවස්ථාවල, එම රාජ්‍යයන්හි සිටින අපරාධ යුක්තිය පසිඳලින අය සමග සහයෝගයෙන් කටයුතු කිරීමට උත්සාහ කල යුතු අතර නිසි අවස්ථාවල, හානිවීමේ අවදානම ඇති අය හට ආරක්ෂාව සැපයීමට වීසා බලපත්‍ර සහ සංක්‍රමණ මාර්ග ලබාදිය යුතුය.

- **මිනිස් ජාවාරමට ලක්වූ අයව කැලැල්වීමෙන් ආරක්ෂා කිරීම මගින් ඔවුන් හට ඉදිරියට ඒමට උපකාර කිරීම:** ගොදුරුවූ අයගේ තොරතුරු සම්බන්ධ රහස්‍යභාවය නගාසිටුවීම මගින් සහ රාජ්‍ය නොවන සංවිධාන, ප්‍රජාවන් සහ ගොදුරුවූවන් අය සමග කටයුතු කිරීම මගින් ඔවුන්ගේ ගැටළු සැලකිල්ලට ගනු ලබන ආරක්ෂණ ප්‍රතිපත්ති වර්ධනය කිරීම මගින්, ගොදුරුවූවන් තුල ඇති ලැජ්ජාව සහ කැලැල් සම්බන්ධයෙන් ඇති බිය සැලකිල්ලට ගනු ලබන උපකාර සහ ආරක්ෂණ වැඩසටහන් ඇතිබවට වගබලා ගත යුතුය.

- **මිනිස් ජාවාරමට ලක්වූ අයව හඳුනාගැනීම වැඩිදියුණු කිරීම සඳහා මිනිස් ජාවාරම සම්බන්ධ මහජන අවබෝධය වැඩි කරන්න:** මිනිස් ජාවාරම සම්බන්ධයෙන් මහජනතාව දැනුවත් කිරීමේ ව්‍යාපාර සඳහා රාජ්‍යයන් මගින් නව උපායන් දියත්කල යුතු අතර ඒ සඳහා උපකාර ලබාදිය යුතුය. එම ව්‍යාපාර මගින් අරමුණු කරන ප්‍රේක්ෂක පිරිස හට පහත දේ පැහැදිලි කරන්නේ නම් ඉතා යෝග්‍යවේ අ) මිනිස් ජාවාරම යනු කුමක්ද සහ එය කුමන ආකාරයක් ගනීද යන්න, සහ ආ) පුද්ගලයන විසින් ගත හැකි ක්‍රියා මාර්ග, හොට්ලයින් දුරකථන මාර්ග ඔස්සේ ලබාදෙන තොරතුරු ඇතුළු, විශේෂයෙන් නිසි අධිකාරීන් වෙත යොමු කිරීම් සඳහා අදාල විස්තර සැපයීම.

- **හඳුනාගැනීම හා සම්බන්ධවන විවිධ පාර්ශවකරුවන්ගේ හැකියාව ශක්තිමත් කිරීම:** කාර්යක්ෂම ලෙස ගොදුරුවූ අයව හඳුනා ගැනීමේ ක්‍රියාවලියේදී පුළුල් පරාසයක රාජ්‍ය අධිකාරීන් සහ වෙනත් අදාල ක්‍රියාකරුවන්ගේ කාර්යභාර සහ වගකීම් සම්බන්ධ පැහැදිලි මාර්ගෝපදේශ සහ මෙහෙයුම් ක්‍රියාපටිපාටීන් හඳුන්වාදීම.

- **මිනිස් ජාවාරම්කරුවන් සමග සම්බන්ධවන පුද්ගලයන් හට හඳුනාගැනීම සම්බන්ධ පුහුණුව ලබාදීම:** මිනිස් ජාවාරමට ගොදුරුවූ අයව හඳුනාගැනීමේදී මුල් පෙළේ නිලධාරීන්ව පුහුණු කිරීමට ප්‍රමුඛත්වය දීම වැදගත්වේ. යම් අයෙකු මිනිස් ජාවාරමට ලක්වූ අයෙකුද යන්න යෝජනා කරන දර්ශක සම්බන්ධයෙන් දැනුවත් කිරීම සඳහා මිනිස් ජාවාරමට ලක්වූ අය සමග සම්බන්ධවන ගුරුවරු, පුවත්පත් කලාවේදීන්, වෛද්‍ය වෘත්තීකයන්, පුද්ගලික අංශයේ ක්‍රියාකරුවන් සහ ප්‍රජාව තුල සිටින වෙනත් අය හට පුහුණුව ලබාදීම සලකා බැලිය යුතුය.

✓ **මිනිස් ජාවාරමට ලක්වන දරුවන් හඳුනා ගැනීම ශක්තිමත් කිරීම:** මිනිස් ජාවාරමට ලක්විය හැකි දරුවන්ව හැකි විගස හඳුනා ගැනීමට ක්‍රියාපටිපාටීන් ක්‍රියාත්මක කිරීම සහ පහත කරුණු දෙකම ඉටුකරන හඳුනාගැනීමේ කාර්‍යාවලි ඔස්සේ විශේෂඥ ළමා සේවා සපයන්නන් හට ක්ෂණිකව දැනුම්දීම:

- බාලවයස්කාරත්වය පූර්වානුමාන කිරීම, සහ
- ගොදුරුවූ තත්වය පූර්වානුමාන කිරීම.

✓ **ගොදුරුවූ අය සම්බන්ධයෙන් සංවේදී සම්මුඛ පරීක්ෂණ උපක්‍රම භාවිතයට උපකාර කිරීම:** භාෂාව, ස්ත්‍රී පුරුෂ බව, වයස සහ සංස්කෘතික සම්බන්ධ කරුණු සලකා බලන නිපුණතාවයන් සම්මුඛ පරීක්ෂණ කරන අය හට ඇති බවට වග බලා ගැනීම. හැකි සෑම අවස්ථාවකම, සම්මුඛ පරීක්ෂණයට භාජනය කරන අය සමඟ සාකච්ඡා කර ඔවුන්ගේ මනාපයන් සොයා බකලා හැකිතාක් දුරට එම මනාපයන් හට ඉඩකඩ ලබාදීම.

✓ **හඳුනාගැනීමේ ක්‍රියාපටිපාටීන් මගින් සරණාගත පතන්නන් හට නිසි යොමු කිරීම් කරන බවට වගබලා ගැනීම:** යම් පුද්ගලයෙකු සරණාගත ඉල්ලා සිටි අවස්ථාවක, හෝ යම් පුද්ගලයෙකු සරණාගතයෙකු බවට විශ්වාස කිරීමට හේතු ඇතිවිට, රාජ්‍යයන් මගින් ඔවුන් පැමිණි රටෙහි තානාපති නියෝජිතයන් හා සම්බන්ධ නොවිය යුතුය.

✓ **දර්ශකයන් මැන බැලීම සලකා බලන්න:** සමහර තොරතුරු සඳහා ප්‍රමුඛතාවය ලබාදීම සඳහා ගොදුරුවූ අයව හඳුනා ගැනීම සම්බන්ධ වගකීම ඇති අයට උපකාර ලබාදීම සඳහා රාජ්‍යයන් මගින් දර්ශකයන් මැන බැලීම සලකා බැලිය යුතුය. ජාත්‍යන්තර කම්කරු සංවිධානය සහ යුරෝපීය කොමිසම විසින් ගනු ලබන ප්‍රවේශය වන්නේ සෑම දර්ශකයක්ම ශක්තිමත්, මධ්‍යම හෝ දුර්වල ලෙස හඳුනාගැනීමයි. මෙයින් අදහස් වන්නේ එක් දර්ශකයක් දරුවන් සම්බන්ධයෙන් ශක්තිමත් වන අතර වැඩිහිටියන් සඳහා මධ්‍යම වන බව හෝ ලිංගික සූරාකෑම් සඳහා මධ්‍යම වන අතර ශ්‍රමය සූරාකෑම සඳහා දුර්වල වන ලෙසත්ය.


✓ **අවශ්‍ය තත්වයට අනුව දර්ශක ගැඩගස්සවා ගැනීම:** දර්ශක ලැයිස්තුව බොහෝ කාර්‍යක්ෂම වන්නේ බලධාරීන් විසින් රාජකාරි කටයුතු කරන අතරතුර මුහුණ දෙන විශේෂිත අවස්ථාවන්ට අනුව අනුවර්තනය වන විටය. වෙනස්වන මිනිස් ජාවාරම් ප්‍රවණතාවලට දිගින් දිගටම අදාල වන අකාරයට රාජ්‍යයන් මගින් සිය දර්ශක ලැයිස්තු යාවත්කාලීන කරගත යුතුය.

# බාලි ක්‍රියාවලිය

REGIONAL SUPPORT OFFICE
THE BALI PROCESS

**සම්බන්ධවීම සඳහා තොරතුරු**
ප්‍රාදේශීය උපකාර කාර්යාලය - බාලි ක්‍රියාවලිය
27වන මහළ රාජනකාර්න් ගොඩනැගිල්ල
3 දකුණු සැතර්න් පාර, සැතර්න්, බැංකොක් 10120,
තායිලන්තය

දුරක. +66 2 343 9477 ෆැක්ස්. +66 2 676 7337
info@rso.baliprocess.net



# මිනිස් ජාවාරම,
# මිනිසුන් වාණිජ වශයෙන් එහා මෙහා ගෙනයාම සහ ආශ්‍රිත ජාතීන් අතර සිදුවන අපරාධ සම්බන්ධ බාලි ක්‍රියාවලිය

http://www.baliprocess.net/